


# පුරාණ පාරායනවග

සහ

# අති පුරාණ පාරායනවග

මාතර හම්බන්තර දෙදිසාවේ ප්‍රධාන සංඝනායක ධුරය ඉසුලූ

ධර්ම විනයධර ශික්ෂාකාමී

අතුරලියේ කීර්ති ශ්‍රී සුමංගලාභිධාන මහා ස්ථවිරපාදයන්

වහන්සේ විසින් සංග්‍රහ කරණලද

# පුරාණ පාරුපනවත

සහ

එසේම ධර්මවිනයධර ශික්ෂාකාමී අන්‍යතර මහා ස්ථවිර

කෙනෙකුන් වහන්සේ විසින් සංග්‍රහ කරණලද

# අති පුරාණ පාරුපනවත.

ආචාර්ය බැන්ඩිගමුල්ලේ ධම්මරතන ස්ථවිරපාදයන්

වහන්සේ විසින්

ලිපිදෝෂාපහරණයෙන් සකස්කරණ ලදුව


මහතරන්ගොඩ

වයි. ඒ. හර්මානිස් අප්පුහාමි

යන මා විසින්

කොළඹ විද්‍යාභූෂණ යන්ත්‍රාලයෙහි

මුද්‍රාපණයෙන් ප්‍රකාශිතයි

ශ්‍රී. බුද්ධ වර්ෂ. 2458

ක්‍රි: ව: 1914

# සංඥාපනය.

—— ○○ ——

**පුරාණපාරුපනවතය අතිපුරාණපාරුපනවතය** යන මේ පොත්දෙක ශාසනිකභික්ෂූන්ගේ ඇඳුම් පෙරවුම් ආදිය සම්බන්ධව විනය පොත්පත් ආදියෙන් කරුණු දක්වමින් පුරාතනවිනයධර මහාස්ථවිරයන් වහන්සේලා දෙනමක් විසින් ශාසනොදයකාමිව අවවාදනුශාසනා වශයෙන් ලියනලද බැව් පෙණේ.

මෙයින් **පුරාණපාරුපනවත** නමැතිපොත මීට හැට අවුරුද්දකට ඉහතදී **අතුරලියේ කිත්තිශ්‍රී සුමංගලාභිධාන** හම්බන්තර මාතර දෙදිසාවේ නායකස්ථවිරපාදයන් වහන්සේ විසින් ලියා ප්‍රසිද්ධකරණලදබව පොත අවසානයෙහි උන්වහන්සේ විසින්ම ලියා තිබේ.

**අතිපුරාණපාරුපනවත** යන [illegible] මෙහි අගට යොදු තිබෙන පොත බෙල්ලන්විල [illegible] සොයාගන්නාලද්දකි. නිවාසනපාරුපනවත යන [illegible] අගට යොදුතිබෙන බැව් පෙණේ නුමුත් අතුරලියේ [illegible] හා පාරුපනවත යන නමින් තිබෙන සෙසු [illegible] ලියූ පොතක්බව පේන හෙයින් හා මුලින් යෙදූ [illegible] පුරාණ යන්නක් එකතුකල හෙයිනුත් ඊට **අතිපුරාණපාරුපනවත** යන නාමය අප විසින් යෙදූබව දතයුතුයි.

බෙල්ලන්විලින් අපට ලැබීතිබෙන මේ පොතේ දුස්කොළ පිට පොත ලියා **අවුරුදු සියයක්** පමණ ගතවීයයි සිතිය හැකි තරමට පරණබව පත්ඉරුවලින් හා අකුරුවලින් පෙණේ. මේ පොතේ සමහර තැන්වල අකුරු කියවාගත නොහැකි තරමට දිරපත්වී තිබුන හෙයින් වචන කීපයක් පිටපත් කර ගන්නට නොහැකිවූ බවද පොතේ මුලපත් ඉරුව සොයාගත නොහැකිවූ හෙයින් දෙවෙනි පත්ඉරුවේ පටන් පිටපත් කරගන්ට සිද්ධවූබවද කියනු කැමැත්තෙමු.

මෙහිදී විශෙෂවශයෙන් කියයුත්තක්ද ඇත එනම්:-ලක්දිව ස්‍යාමනිකායික සමහර භික්ෂූන් **සුපටිච්ඡන්න** නොව ( එකාංශව සිවුරු පොරවාගෙණ) ගම්වැදීම පටන්ගන්නට ඉහතදී මේ පොත ලියාතිබෙනබැව් මේ පොතේ පැරණිකමමත් පමණක් නොව කරුණුවලින්ද ඉතාම පැහැදිලිව පෙණෙන බවයි, ඒ බැව් මේ පොතේ 27 වෙනි පිටේ **"නැටවවු ගන්නා යම් කිසි කරුණක් ගැණ ගමට වැදුන කල්හි සැරයටි වටාපත් ආදිය ගන්නා පිණිස දකුණු අත එලියට ගන්නාවූ ඒ පැත්තෙන් සිවුර උස්ව දුම්‍ර අය**

මත් අවලක්ෂණව මණ්ඩලාකාරයෙන් වැරදී වැලඹීමට බාහුශිෂ්‍යය
දක්වාම අප්‍රතිච්ඡන්නව පෙණේ යනබැවින් පරිමණ්ඩලං පාරුපි
ස්සාමි යන ශික්ෂාපදයද සුපටිච්ඡන්නො යන ශික්ෂාපද දෙකද න
උක්ඛිත්තකාය අන්තරඝරෙ යන ශික්ෂාපද දෙකද යන ශික්ෂාපද
පසක්ම නොරැකි බිඳි යනබව පෙණෙන්නාය'' යන වාක්‍යය
බැලූ කල්හි නිසැකවම වැටහෙයි.

ගම්වැදීමට ගැටවවු කොට සිවුරු පෙරවූ කල්හි දකුණු අත
වැසෙනබව මෙයින්ද ප්‍රකාශවෙයි. ඒකාංශකොට පෙරවූ කල්හි
කිසි ලෙසකින් දකුණු අත නොවැසෙනහෙයින් මෙහි කියනලද්දේ
ඒකාංශපාරුපනය නොව දෙඅංසය වැසෙන පෙරවීමක් බව සැල
කියයුතුයි, ඇදුම් පෙරවුම් ආදිය සම්බන්ධව ඒ කාලයෙහි සිටිය
භික්ෂූන් අතර පැවතුන වැරදිගැණ මේ පොතේ නොයෙක් ලෙසින්
අවවාද කළ නුමුත් ඒකාංශපාරුපනයෙන් ගම්වැදීමක් ගැණ මෙහි
කිසි තැනක අවවාදයක් ප්‍රකාශකර නොමැතියි. නුමුත් ගැටවවු
කල සිවුරෙන් වැසී තිබෙන දකුණුඅත මැණික්කට්ටුවෙන් උඩ පෙ
ණෙනසේ සිවුරු ගැබින් බැහැරට ගැණීමේ වැරැද්ද විස්තාර කර
මින් එසේ නොකොට දකුණුඅතත් වසාගැණීමට අවවාදකරනිබේ.

මේ කරුණුවලින් නිසැකලෙසම තේරුම් ගන්නට තිබෙන්
නේ ලාංකික භික්ෂූන් ඇතුළුගමට ඒකාංශපාරුපනය පටන්ගැණී
මට පළමුවෙන් මේ පොත ලියාතිබෙන බවයි. ඇදුම් පෙරවුම් සම්බ
න්ධව නානාමතිකව වාදභෙදපන්නව සිටින ගිහි පැවිදි පින්වතුන්
ලාට මේ පොතෙන් පෙන්වා දෙන්ට අප අදහස් කළේත් ඒ කාර
ණය පමණක්මයයි සැලකියයුතුයි. ආගමානුකූල පෙරවීම කුමක්ද
කෙසේද යනු ඇත්තවශයෙන් තේරුම්ගණු කැමති ශාසනාලය
ඇති පින්වතුන්ලාට මෙහි මුලින් යොදා තිබෙන පුරාණපාරුපන
වත බැලීමෙන් එය තේරුම්ගත හැක්කේයයි සිතමු.

ධර්මය යටපත් කොට දමා අධර්මය බහුලවන්ට උත්සාහදරන්
නන් බහුලකොට ඇති මේ කාලයෙහි ඇත්ත පිළිගණු කැමති පර
ලොව ගරුකරණ පින්වතුන්ලාට අනුබල දීමක් වශයෙන් සලකා
ශාසනානුග්‍රහ බුද්ධියෙන් මේ පොත් දෙක ලොකයා අතර ප්‍රකාශ
කරවීමට අදහස් කෙළෙමු.

මීට: –

ශාසනොදයාර්ථී ගම්පහ පහලගම
යටවත්තේ විහාරාධිවාසී

බැන්ඩියමුල්ලේ ධම්මරතනස්ථවිරයෝ.

ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 2458 ට පැමිණි
අගොස්තු මස 25 වෙනි දිනදීය.

# ශුද්ධි පත්‍රය.

———00———

| පිට, | පෙල, | අසුද්ධ, | සුද්ධ, |
|---|---|---|---|
| 1 | 11 | චාරිත්‍ර | චරිත්‍ර |
| 1 | 20 | පටවුත්තරා | පච්චුත්තරා |
| 2 | 14 | දස්සෙත්වා | දස්සෙත්වා |
| 2 | 28 | දන | දණ |
| 3 | 3ó | ආපදුඊමයෙනි | ආපදඊවයෙහි |
| 4 | 13 | වදුල | වදුල |
| 4 | 15 | ශික්ඛා | සික්ඛා |
| 4 | 30 | මිහාජෙඪක | මහාජෙඨක |
| 5 | 23 | ග්‍රීවය | ග්‍රීවාව |
| 6 | 29 | ඉත | ඉතා |
| 7 | 16 | ග්‍රීවය | ග්‍රීවාව |
| 7 | 29 | මත | මතා |
| 7 | 33 | දස්සාතං | දස්සතං |
| 8 | 5 | අතාලම්බෙත්වා | අතොලම්බෙත්වා |
| 9 | 1 | පඨායසීසං මණිබන්ධතො | (වැඩි පාඨයකි) |
| 10 | 9 | එකංශ | එකාංශ |
| 10 | 21 | තාවකාලිකමව | තාවකාලිකමෙව |
| 10 | 24 | වාසසථාන | වාසස්ථාන |
| 10 | 26 | කල් | කල්හි |
| 10 | 29 | යන්ාවූ | යන්තාවූ |
| 13 | 29 | නිමිත්ත | නිමිත්තං |
| 13 | 36 | පඨය | පඨාය |
| 16 | 17 | අනත්සරනානි | අනත්තරස්සරනානි |
| 19 | 16 | පැගෙත්තේය | හැගෙත්තේය |
| 20 | 30 | සුපපටිපන්නාභික්ඛු | සුපපටිපන්නො භික්ඛු |
| 20 | 31 | පිළිපැද්දහු | පිළිපැද්දහුනම් |
| 21 | 8 | දක්ටා | දක්වා |
| 24 | 17 | ලහුකායසංඝාටියා | ලහුකා සංඝාටියො |
| 24 | 21 | ගණ්ඨිපාසා | ගණ්ඨිපාස |
| 25 | 10 | අඪිකථ | අඪිකථා |
| 25 | 14 | අජානස්ස | අජානන්තස්ස |
| 26 | 16 | අනත්තමසො | අනන්තමසො |
| 26 | 32 | උත්තරසංගය | උත්තරාසංගය |
| 27 | 5 | බහුශීර්ෂය | බාහුශීර්ෂය |
| 27 | 5 | අප්‍රතිච්ඡන්නව | අප්‍රතිච්ඡන්නාව |
| 27 | 17 | සූචිං | සූචි |
| 27 | 21 | පචචත්තරණං | පච්චත්තරණං |
| 27 | 30 | නිත්‍යවිතතසන්තපාදිය | නිත්‍යවිතත සන්තානපාදිය |
| 28 | 3 | දුෂ්ප්‍රතිපන්නවූවාහු | දුෂ්ප්‍රතිපන්නවූවන් |
| 28 | 5 | පාපුනාති | පාපුණාති |
| 28 | 10 | අයති | ආයති |

# පූරාණ පාරුපනවත

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

ශ්‍රී ඝනසුගතතථාගතවූ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ විසින් භික්‍ෂූන් උදෙසා පනවා වදාරණලද පන්සැත්තෑවක් සෙඛියා ශික්‍ෂාපදයන් අතුරෙහි පළමුකොට දක්වනලද පරිමණ්ඩල නිවාසන පාරුපනසඞ්ඛ්‍යාතවූ සිවුරුහැඳීම පෙරවීමනම් ශ්‍රමණරූපයට ප්‍රධාන කාරණයක්සෙයින්ද චීවරධාරණය කරණකොටගෙණ ශ්‍රමණව්‍යවහාරය ලබනහෙයින්ද ලොකයාවිසින් කරණලද වැඳීම් පිදීම් ආදියටහේතුවූ හෙයින්ද පංචානන්තඝාතනයෙන් ලිංගනාශනඝාතනය දක්වාගෙණයනුලබන සෙයින්දැයි යනාදිවශයෙන් නිවාසන පාරුපනදෙක ශ්‍රමණයන් වහන්සේලා විසින් මනාකොට පැවැත්විය යුතු චාරිත්‍රධර්මයක් බැවින් සිවුරුහැඳීම් පෙරවීම්දෙකෙහි ක්‍රම විභාගය ධර්මවිනය දෙකෙහි ප්‍රකාශවූපරිද්දෙන් මදක් සංක්‍ෂෙපයෙන් ලියාදක්වනුලැබේ. හේ කෙසේදයත්?

"අනුජානාමි භික්ඛවෙ තිචීවරං දිගුණං සංඝාටිං එකච්චියං උත්තරාසංගං එකච්චියං අන්තරවාසකං"යි, යනුවෙන් දෙපටින් සඟළ සිවුරද එකපටින් උත්තරාසංගය සහ අඳනයද කරගැණීමට භික්‍ෂූන්ට බුදුන්විසින් අනුදැනවදාරණ ලද්දේය. එබව, "දිගුණන්ති දුපට්ටං එකච්චියන්ති එකපට්ටං,යි අටුවාවෙහි දැක්වූහ.

අහතාහතකප්පානං සංඝාටිදිගුණාමතා
එකපට්ටුත්තරාසංගො එකමන්තරවාසකො.

යන මෙයිනුදු සඟළසිවුර දෙපටින්ද උත්තරාසංගය සහ අඳනය එකඑකපටින්ද කරගන්ට නියමවහිඛෙනබව ප්‍රකාශවන්නේය. මෙසේ කරණලද තුන්සිවුරෙන් පළමුකොට අඳනය අඳිනා කල්හි,,න භික්ඛවෙ ගිහිනිවාසනං නිවාසෙතබ්බං "පෙ" එවං ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ පරිමණ්ඩලං නිවාසෙස්සාමීති සික්ඛාකරණීයා,, යනුවෙන් බුදුන්විසින් එපාකරවදාළ හත්ථිසොණ්ඩාදිදොෂයන් වර්ජිතකොට වටසමකර මණ්ඩලාකාරයෙන් ඇන්දයුතුබව මෙහිප්‍රකාශිතයි.,, [illegible] තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ගිහිනිවත්ථං නිවාසෙන්ති හත්ථිසොණ්ඩකං මච්ඡවාලකං චතුක්කණ්ණකං තාලවණ්ටකං සතවලිකං නිවාසනාභිසංවෙල්ලියං නිවාසෙන්තීති ඛන්ධකෙ නිවාසනදෙසා

වුත්තා තථානිවාසෙන්තස්සාපි දුක්කටමෙව,, යනුවෙන් දක්වන ලද හත්ථිසොණ්ඩකාකාරය මච්ඡවාලකාකාරය චතුක්කණ්ණකාකාරය තාලවණ්ටකාකාරය සතවලලිකාකාරය සංවෙල්ලියාකාරයයි යනාදි ගිහිනිවාසනාකාරයට අදින්නාහට ආපත්ති වනබව දක්වූහ.

ඒ හස්තිසොණ්ඩාදිවූ ගිහින්ගේ ඇඳීමෙහි ලක්ෂණ නම් ''තත්‍ථ හත්‍ථිසොණ්ඩකං නාම නාභිමූලතො හත්‍ථිසොණ්ඩසණ්ඨානං ඔලම්බකං කත්‍වා නිවත්‍ථං චොළිකිත්‍ථීනං නිවාසනංවිය මච්ඡවාලකං නාම එකතොදසන්තං එකතොපාසන්තං ඔලම්බෙත්‍වා නිවත්‍ථං චතුක්කණ්ණකංනාම උපරි ද්වෙ හෙට්ඨතො ද්වෙති එවං චත්තාරො කණ්ණෙ දස්සෙත්‍වා නිවත්‍ථං තාලවණ්ටකං නාම තාලවණ්ටාකාරෙන සාටකං ඔලම්බෙත්‍වා නිවත්‍ථං සතවලලිකංනාම දීඝසාටකං අනෙකක්ඛත්තුං ඔභඤ්ජිත්‍වා ඔවට්ටිකං කරොන්තෙන නිවත්‍ථං වාම දක්ඛිණපස්සෙසු වා නිරන්තරංවලියො දස්සෙත්‍වා නිවත්‍ථං සචෙ පන ජාණුතොපට්ඨාය එකාවෙවාවලියො පඤ්ඤායන්ති වට්ටති. සංවෙල්ලියන්ති මල්ලකම්මකාරාදීනං විය කච්ඡං බන්ධිත්‍වා නිවත්‍ථං එවං නිවාසෙතුං ගිලානස්සාපි මග්ගපටිපන්නස්සාපි න වට්ටති,, යනු එහිලක්ෂණයි. මෙසේ ප්‍රතික්ෂෙපකරණලද සියලු දෝෂයන්හැර පරිමණ්ඩලලක්ෂණයෙන් සමන්විතව ඇන්දයුතු වන්නේය. කෙසේද?

''තත්‍ථ පරිමණ්ඩලන්ති සමන්තතො මණ්ඩලං නාභිමණ්ඩලං ජාණුමණ්ඩලංති උද්ධං නාභිමණ්ඩලං අධො ජාණුමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන ජාණුමණ්ඩලස්ස හෙට්ඨා ජංඝට්ඨිකතො පට්ඨාය අට්ඨඞ්ගුලමත්තං නිවාසනං ඔතාරෙත්‍වා නිවාසෙතබ්බං තතොපරං ඔතාරෙන්තස්ස දුක්කටන්ති වුත්තං යථානිසින්නස්ස ජාණුමණ්ඩලතො හෙට්ඨා චතුරඞ්ගුලමත්තං පටිච්ඡන්නං හොතීති මහාපච්චරියං වුත්තං,,

යනුවෙන් හාත්පසින් මණ්ඩලාකාරව උඩින් නාභිමණ්ඩලයද යටින් ජාණුමණ්ඩලයද ප්‍රතිච්ඡාදනය කරන්නහුවිසින් දනමඩලින්යට අඟුලක්පමණ අඳනය බහාඇන්ද යුතුය. ඉන්වඩා පාත්කොට අදින්නාහට ආපත්තියයි දක්වනලද්දේය, යම්සේ උන්නාහුගේ දණමඩලින්යට සතරඟුලක්පමණ වැසුනේවේද එසේත් වටනේයයි මහාපච්චරියෙහි කියනලදයි දක්වූහ. ''අට්ඨඞ්ගුලමත්තන්ති මත්තසද්දෙන තතො කිඤ්චි අධිකං ඌනම්පි සංගණ්හාති,, යනුවෙන් අඟුලක්පමණැයිකියා මාත්‍රාශබ්දයෙන් දක්වූහෙයින් ඉන්මඳක් අඩුවැඩිවුවත් අනාපත්තිබව ප්‍රකාශවන්නේයි.

“යො පන සුක්ඛජංඝො වා හොති මහාපිණ්ඩිකමංසො වා හොති තස්ස සාරුප්පත්ථාය අට්ඨංගුලාධිකම්පි ඔතාරෙත්වා නිවාසෙතුං වට්ටති,, යනුවෙන් යමෙක් ශුෂ්කවූසිහින් ජංඝා ඇත්තේහෝවේද මහත්වූකෙණ්ඩා ඇත්තේහෝවේද ඕහට සරුප්පිණිස අටඟුලෙන් වැඩිය අඳනය පාතටබහා අඳින්ටවටනේයයි දක්වූහ. “එවං නිවාසෙන්තස්ස පන නිවාසනං පමාණිකංවට්ටති තත්‍රිදංපමාණං දීඝතො මුට්ඨිපඤ්චකං තිරියං අඩ්ඪතෙය්‍යහත්ථං තාදිසස්ස පන අලාභෙ තිරියං විහත්ථප්පමාණම්පි වට්ටති ජාණුමණ්ඩලපටිච්ඡාදනත්ථං නාභිමණ්ඩලම්පන චීවරෙනාපි සක්කා පටිච්ඡාදෙතුංති තත්ථ එකපට්ටචීවරං එවං නිවත්ථම්පි ඨානෙනාතිඨතිදූපට්ටං පන තිඨති,, යනුවෙන් මෙසේ අඳින්නාහට වනාහි අඳනය දිගින්මිට්පස්රියනක්ද පළලින් දෙරියන්හමාරක්ද ප්‍රමාණවටනේය ඒප්‍රමාණ නොලත් කල්හි පළලින් දෙරියන්පමණද වටනේය. නාභිමණ්ඩලය වනාහි පොරවන සිවුරෙන්ද වසන්ට හැකිබැවින් දණමඩලවැසීම පිණිස පළලින් දෙරියනඇතැයි යන අභිප්‍රායයි. ඒ ප්‍රකාරයට තනිපට අඳනය අඳිනලද්දේ යථාස්ථානයෙහි නොසිටිනාබැවින් දෙපට අඳනය වටනේයයි කියනලදී.

“එවං අනිවාසෙත්වා අනාදරියෙන පුරතො වා පච්ඡතො වා ඔලම්බෙත්වා නිවාසෙන්තස්ස දුක්කටං,, යනුවෙන් හාත්පසින්වටසම කර මණ්ඩලාකාරව නොඇඳඅනාදර වශයෙන් ඉදිරියෙන් හෝ පස්සෙන් හෝ කොන්එල්වා අඳින්නාහට දුස්කටවන්නේයයි දක්වූහ. “නිවාසනවත්තං සාධුකං උග්ගහෙතබ්බමෙව සංචිච්ච අනුග්ගණ්හන්තස්ස හි අනාදරියං සියා එවං නිවාසෙස්සාමීති ආරාමෙපි අන්තරඝරෙපි සබ්බත්ථසික්ඛාකාතබ්බා අනාදරියං පටිච්චදුක්කටන්ති නිවාසනවත්තං අජානන්තස්ස මොක්ඛොනත්ථි,,යි යනුවෙන් අඳින්නාවූ ලක්ෂණසඞ්ඛ්‍යාත වත මනාකොට උගතයුතුමය. දැනදැනනූගන්නාහට වනාහි ශික්ෂාපදයෙහි ආදරයක් නොවන්නේය. එබැවින්මෙසේ හඳිම්යිකියා ආරාමයෙහිද අන්තරඝරයෙහිද යන සැමතන්හි හික්මීම නොමෝ කටයුතුවන්නීය. එසේනොව අනාදරවශයෙන් නොහික්මීම කරණකොටගෙණ දෝෂවන්නේය නිවාසනවත නොදන්නාහට මොක්ෂයෙක් නැත්තේයයි දක්වනලදී. “ඉමස්මිං නාව සික්ඛාපදෙ අසංචිච්චඅසතියා අජානන්තස්ස ගිලානස්සආපදාසු උම්මත්තකාදීනංච අනාපත්ති,, යනුවෙන් පරිමණ්ඩලාකාරයෙන් හඳිම්යිකියාවැරද අපරිමණ්ඩලව හඳින්නාහටද අන්‍යවිහිතයාහටද පරිමණ්ඩලාකාරව අඳින්ට නොදන්නාහටද රෝගාතුරයාහටද ආපදාවෙහිද උම්මත්තකාදීන්ටද අනාපත්තිවන්නේය. මේ ශික්ෂාපදයෙහි නිදානපුද්ගලවස්තු සහ ආපත්තිසමුට්ඨානාදියද

අට්ඨකථා පාළිවූපරිද්දෙන්දතයුතුය. මෙහි වනාහි සංක්ෂෙපය වන්නේය. මේ පරිමණ්ඩලාකාරයෙන් අඳනය අඳින්ට අනුදැන වදාළ පළමුවෙනි ශික්ෂාපදයෙහි ක්‍රමයයි.

නැවත කායබන්ධනය අනුදැනවදාළ පරිදි නම් “තෙනඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අකායබන්ධනෙන ගාමං පිණ්ඩාය පාවිසි තස්ස රථියා අන්තරවාසකො භස්සිත්ථ මනුස්සා උක්කුට්ඨිං අකංසු සො භික්ඛු මංකු අහොසි අථඛො සො භික්ඛු භික්ඛූනං එතමත්ථං ආරොචෙසි භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං, න භික්ඛවෙ අකායබන්ධනෙන ගාමො පවිසිතබ්බො යො පවිසෙය්‍ය ආපත්ති දුක්කටස්ස අනුජානාමි භික්ඛවෙ කායබන්ධනන්ති,, යි යනුවෙන් අඳනය ඇඳර්පිට පටිය බඳින්ට අනුදැන වදාළ ක්‍රමයයි.

නැවත උත්තරාසංගය හෙවත් තනිපටසිවුර පෙරවන්ට අනුදැනවදාළ පරිදි දක්වමි. කෙසේද?

ශ්‍රාවස්තිනිදනයෙහි ෂට්වර්ගිකභික්ෂූන් උදෙසා “එවං ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ “පෙ” පරිමණ්ඩලං පාරුපිස්සාමීති සික්ඛාකරණීයා.” “පෙ” යො අනාදරියං පටිච්ච පුරතොවා පච්ඡතොවා ඔලම්බෙන්තො පාරුපති ආපත්තිදුක්කටස්ස,, යි යනුවෙන් හාත්පසින් වටකොට පොරවමියි යන ශික්ෂාතොමෝ කටයුතුනීයයි වදාළ බැවින් දෙකොණ සමකොට මණ්ඩලාකාරව නොපොරවා ඉදිරියෙන් හෝ පස්සෙන් හෝ කොන්එල්වමින් ශික්ෂාපදයට අනාදරවශයෙන් ශ්‍රමණසාරූප්‍ය නොවනලෙස විකාර දක්වා පොරවන්නාහට ආපත්තිසිද්ධවනබව ප්‍රකාශවන්නේය.

“තෙන ඛොපන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ගිහිපාරුතං පාරුපන්ති මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති සෙය්‍යථාපි ගිහීකාමභොගිනොති භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං, න භික්ඛවෙ ගිහිපාරුතං පාරුපිතබ්බං යො පාරුපෙය්‍ය ආපත්ති දුක්කටස්සාති,, යනුවෙන් උපාකරවදාළ ගිහිපාරුපනයෝ නම් කවරහුද?

“තත්ථ යං කිංචි සෙතපටපාරුතං පරිබ්බාජකපාරුතං එකසාටකපාරුතං සුරාසොණ්ඩපාරුතං අන්තෙපුරිකපාරුතං මහාජෙට්ඨකපාරුතං කුටිපවෙසකපාරුතං බ්‍රාහ්මණපාරුතං පාලිකාරකපාරුතන්ති එවමාදි පරිමණ්ඩලලක්ඛණතො අඤ්ඤථාපාරුතං සබ්බමෙතං ගිහිපාරුතං නාම,, යනුවෙන් සෙතවස්ත්‍රපාරුපනය පටන් පාලිකාරකභික්ෂූහුගේ පාරුපනයදක්වා මෙහි ප්‍රකාශවූ නවප්‍රකාර සියලුම පාරුපනයෝ පරිමණ්ඩලපාරුපනයට කීලක්ෂණයෙන් වෙනස්වූසෙයින් ගිහිපාරුපනයෝනම්වෙත් ඒ නවප්‍රකාරපාරුපන

යත්ගේ ලක්ෂණ මතුකියන පරිද්දෙන් දතයුතුයි. "යථා සෙතපටා
අඩ්ඪපාලකනිගණ්ඨා පාරුපන්ති යථාච එකච්චෙ පරිබ්බාජකා උරං
විවරිත්වා ද්වීසු අංසකූටෙසු පාපුරණං ඨපෙන්ති යථාච එකසාටකා ම
නුස්සා නිවත්ථසාටකස්ස එකෙනන්තෙන පිට්ඨිං පාරුපිත්වා උභො
කණ්ණෙ උභොසු අංසකූටෙසු ඨපෙන්ති යථාච සුරාසොණ්ඩාදයො
සාටකෙන ගීවං පරික්ඛිපන්තා උභො අන්තෙ උරෙ වා ඔලම්බෙන්ති
පිට්ඨියං වා ඛිපන්ති යථාච අන්තෙපුරිකායො අක්ඛිතාරකමත්තං ද
ස්සෙත්වා ඔගුණ්ඨිකං පාරුපන්ති යථාච මහාජෙට්ඨා දීඝසාටකං
නිවාසෙත්වා තස්සෙව එකෙනන්තෙන සකලසරීරං පාරුපන්ති
යථාච කස්සකා ඛෙත්තකුටිං පවිසන්තා සාටකං පලිවෙඨෙත්වා
උපකච්ඡකෙ පක්ඛිපිත්වා තස්සෙව එකෙනන්තෙන සරීරං පාරු
පන්ති යථාච බ්‍රාහ්මණා උභින්නං උපකච්ඡකානං අන්තරෙ සාට
කං පවෙසෙත්වා අංසකූටෙසු පක්ඛිපන්ති යථාච පාලිකාරකො භික්ඛු
එකංස පාරුපනෙන පාරුතං වාමබාහුං විවරිත්වා චීවරං අංසකූටෙ
ආරොපෙති එවං අපාරුපිත්වා සබ්බෙපි එතෙ අඤ්ඤෙච එවරූපෙ
පාරුපනදොසෙ විවජ්ජෙත්වා නිබ්බිකාරං පරිමණ්ඩලං පාරුපිත
බ්බං තථා අපාරුපිත්වා ආරාමෙ වා අන්තරඝරෙ වා අනාදරෙන යං
කිංචිවිකාරං කරොන්තස්ස දුක්කටං.,, යනුවෙන් අඩ්ඪපාලකනිගණ්ඨ
යෝ ශරීරයෙන් අර්ධයක්වසා සුදුවස්ත්‍ර පොරවන්නාහුය සමහර
පරිබ්‍රාජකයෝ හෘදය විවෘතකොට දෙඅංසකූටයෙහි පොරෝනය
තබන්නාහුය එකවස්ත්‍රයක් අඳින්නාවූ මනුෂ්‍යයෝ අඳිනලද
වස්ත්‍රයාගේ එක්කෙළවරකින් පිටවසා පොරවා දෙකොණ දෙඅං
ශකූටයෙහි තබන්නාහුය සුරාධූර්තකාදීහු වස්ත්‍රයෙන් ග්‍රීවය වට
කර දෙකෙළවරගෙණ ළයෙහිහෝ එල්වන්නාහුය පිටෙහි හෝ
බහාලන්නාහුය අන්තඃපුරස්ත්‍රීහු ඇස්පිහිනිය පමණක් දක්වා
ඉහසිට වසාපොරවන්නාහුය. ශ්‍රෙෂ්ඨමහාමාත්‍යාදීහු දික්වස්ත්‍රයක්
හැඳ ඒ වස්ත්‍රයාගේම එක්කෙළවරකින් සකලශරීරයවසා පොර
වන්නාහුය ක්ෂෙත්‍රපාලකගොවීහු පැළටයනකල්හි වස්ත්‍රයවෙළා
කිසිල්ලසමීපයෙහි ප්‍රක්ෂෙපකොට ඒ වස්ත්‍රයාගේම එක්කෙළවර
කින් ශරීරයවසා පොරවන්නාහුය බ්‍රාහ්මණයෝ දෙකිසිල්ල අත
රෙහි වස්ත්‍රය ප්‍රවෙශකොට දෙඅංශකූටයෙහි බහාලන්නාහුය.
පෙලසාධන භික්ෂූන්ව එකාංශපාරුපනයෙන් පොරවනලදුව වාම
බාහුව විවෘතකොට අංශකූටයෙහි සිවුරනගන්නේයයි යනාදිවශ
යෙන් දක්වූ නවප්‍රකාරපාරුපන දොෂයන් ඇතුළුවමෙවනත් විඩම්බ
නාකාර විකාරපෙරවීම්හැර දෙකොණසමකොට මණ්ඩලාකාරව
පෙරවියයුතුය එසේ නොකොට ආරාමයෙහි හෝ ඇතුළුගමෙහි

හෝ යම්කිසිවිකාරයක් කරන්නාහට ආපත්තිසිද්ධවන්නේයයි දක්වූහ.

අවිසෙසෙන වුත්තත්තා ඉදං සික්ඛාපදමයං
තස්මා ඝරෙ විහාරෙවා කත්තබ්බං පරිමණ්ඩලං,

යනුවෙන් මේ පරිමණ්ඩලශික්ෂාපදවය ස්ථානයක් නියම් නොකොට වදාළබැවින් ඇතුළුගමෙහිද විහාරයෙහිද මණ්ඩලාකාරව නිවාසන පාරුපනදෙක කටයුතුයයි දක්වූහ.

විහාරෙවාති බුද්ධුපට්ඨානාදිකාලං සන්ධාය වුත්තං, පරිමණ්ඩලං කාතබ්බන්ති පරිමණ්ඩලමෙව නිවාසෙතබ්බං පාරුපිතබ්බන්ති අත්ථො,, යනුවෙන් 'විහාරෙවා' යන පදයෙන් බුදුන්ට උපස්ථානයට එලඹෙනකල්හිද මල්පිදීම්ආදිය පිණිස චෛත්‍යස්ථානයට එලඹෙනකල්හිද දෙකොණසමකොට නොත්නල්ෂනාඑල්වා මනාකොටහැඳපෙරව යායුතුබව දක්වූහ. මෙහිආදිශබ්දයෙන් ථෙරදර්ශනාදිය ප්‍රකාශිතයි, තවද

“නච තස්ස භොතො ගොතමස්ස කායෙ චීවරං අච්චුක්කට්ඨං හොති නච අච්චොක්කට්ඨං, මෙහිඅභිප්‍රායනම් ඒ භාග්‍යවත් ගෞතම ස්වාමීන් වහන්සේගේ ශරීරයෙහි චීවරය ඉතාඋස්කොට නගා නොපෙරවනසේක ඉතා පාතටබහා නොපෙරවනසේක, මෙසේ උස්කොට පෙරවීමෙහිද පාතට බහා පෙරවීමෙහිද, ලක්ෂණනම්. අච්චුක්කට්ඨන්ති යොහි යාව හනුකට්ඨිතො උක්ඛිපිත්වා පාරුපති තස්ස අච්චුක්කට්ඨං නාමහොති. යො යාව නොපුච්ඡකා ඔතාරෙත්වා පාරුපති තස්ස අච්චොක්කට්ඨං හොති යොපි උභතො උක්ඛිපිත්වා උදරං විවරිත්වා යාති තස්සපි අච්චොක්කට්ඨං හොති යො එකංසං කත්වා එකං විවරිත්වා යාති තස්සපි අච්චොක්කට්ඨං සත්ථා තං සබ්බං නකරොති, යනුවෙන් යම් මහණෙක් හනු ඇටෙන් මත්තට සිවුර නගා පොරවාද ඔහුගේ ඒ පෙරවීම ඉතා උඩට නගා පෙරවීම නම් වේ. යමෙක් ගොප් මස දක්වා බහා පොරවාද ඔහුගේ ඒ පෙරවීම ඉතා යටට නගා පෙරවීම නම්වේ. යමෙක් වනාගි දෙපාර්ශ්වයෙන් සිවුර නගා උදරය විවෘතකොට යේද ඔහුගේ ඒ පෙරවීමත් ඉත උඩට නගා පෙරවීම නම් වේ. යමෙක් සිවුර එකාංශ කොට පෙරවා තනය විවෘත කොට යේද ඔහුගේ ඒ පෙරවීම ඉතා යටට බහා පෙරවීම නම් වේ. ශාස්තෲවූ බුදු රජතෙම මේ සියල්ලම නොකරන්නේයයි දක්වූහ. මෙසේ සූත්‍ර පිටකයෙහිද පාරුපන විධිය දක්වන ලද්දේය. මෙහි ප්‍රකාශවූ ක්‍රමයට එකාංශ පාරුපනය සහ උභයාංශය වශයෙන් පෙරවීම හැඟෙන්නේය. තවද මෙහි ඉහත දක්වූ නව ප්‍රකාර ගිහි පාරුපන ඇතුළුව වෙනත් පාරුපන දෝෂයන් දුරුකොට කොන් නොඑල්වා දෙකොණ සමකොට මණ්ඩලාකාරයෙන්ම එකාංශපාරුපනයද උභයාංශපාරුපනයද යන දෙකම යහ

ප්ලෙස පැවැත්වීමෙන් මේ දෙවෙනි පරිමණ්ඩලපාරුපන ශික්ෂා පදයද රක්ෂා කටයුත්තේය.

තවද දෙඅංසකූටය වසා පෙරවා ගැටවටු කොට සුපිළිසත්ව ඇතුළුගම්හි යායුතුය හිත්ද යුතුයයි පනවා වදාළ තුන්වෙනි සතර වෙනි ශික්ෂාපදවයෙහි විභාග නම්? "සුපටිච්ඡන්නො අන්තර ඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා,, යනුවෙන් සුපිළිසත්ව ඇතුළු ගමෙහි යම්යියන ශික්ෂාතොමෝ කටයුත්තීයයි යන දෙශනා පාලිය වන්නේය. මෙහි අර්ථ විස්තර වශයෙන් දක්වන අර්ථකථාචාරීන් වහන්සේ විසින්

"තතියෙ- සුපටිච්ඡන්නොති සුඨුපටිච්ඡන්නො ගණ්ඨිකං පටිමුඤ්චිත්වා අනුවාතන්තෙන ගීවං පටිච්ඡාදෙත්වා උභොකණ්ණෙසමං කත්වා පටිසංහරිත්වා යාවමණිබන්ධං පටිච්ඡාදෙත්වා අන්තර ඝරෙ ගමිස්සාමීති අත්ථො. තථා අකත්වා ජත්තුං වා උරං වා විවරිත්වා ගච්ඡන්තස්ස දුක්කටං,, යනුවෙන් සුප්‍රතිච්ඡන්නයනම් මනාකොට වැසීම වන්නේය. කෙසේද ගැට වටු කොටතුවාවගේ කෙළවරින් ග්‍රීවය වසා දෙකොණ සමකොට හකුළා මණිබන්ධය දක්වා වසා ඇතුළු ගම්හි යම්යි යන අර්ථයි. එසේ නොකොට අංශකූටය සහ හෘදයද නොවසා යන්නා හට ආපත්තිවන්නේයයි දක්වන ලද්දේය.

"සුපටිච්ඡන්නොති නසීසං පාරුතෙන අථ ඛො ගණ්ඨිකං පටිමුඤ්චිත්වා අනුවාතන්තෙන ගීවං පටිච්ඡාදෙත්වා උභොකණ්ණෙ සමං කත්වා පටිසංහරිත්වා යාවමණි බන්ධං පටිච්ඡා දෙත්වා අන්තරඝරෙ ගන්තබ්බං" යන මෙහිද සුප්‍රතිච්ඡන්නය නම් හිස වසා නොපෙරවීමයයි දක්වනලදී ඒ බව දක්වනටීකාචාරීන් වහන්සේ" සුපටිච්ඡන්නොති වුත්තත්තා සසීසං පාරුතො සබ්බථා (සු) පටිච්ඡන්නත්තා සුපටිච්ඡන්නො හොතීති යස්ස සියා තං සන්ධායාහ නසීසං පාරුතෙනාති ආදි, මෙහි අභිප්‍රාය නම් සුප්‍රතිච්ඡාදන යෙන් යායුතුයයි වදාළ බැවින් හිස සහිතව වසා පෙරවූ කල්හි සර්ව ප්‍රකාරයෙන්ම ශරීරය වැසෙන හෙයින් එසේ කළ කල්හි මනාකොට වැසීම නම් වෙයි කියා යම් කෙනෙකුට එබඳු සිතක් ඉපදී හිස වසා පොරවාගෙණ යනවාඇත යන කාරණය සඳහා හිස වසා පොරවාගෙණ නොවෙයි යනාදිය කීයේයයි දක්වූහ.

එහිම, ගණ්ඨිකං පටිමුඤ්චිත්වාති ආදි පටිච්ඡාදන විධිදස්සා, තං ගීවං පටිච්ඡා දෙත්වාති ආදිනා වුත්තත්තා සංචිච්ච ගීවං මණිබන්ධංච අපටිච්ඡාදෙන්තස්ස ආපත්ති, යනුවෙන් ගණ්ඨිකං පටිමුඤ්චිත්වා යනාදි පදවලින් ප්‍රතිච්ඡාදනය කරණ විධි දක්වීම

වන්නේය. එහෙයින් “ගීවං පටිච්ඡාදෙත්වා, යනාදි වශයෙන් කියනලද බැවින් දූත දූත ග්‍රීවයද මණි බන්ධනයද නොවසන්නා හට ආපත්ති වන්නේයයි දක්වූහ,, එත්ථාපි පරිමණ්ඩල සික්ඛාපදස්ස සාධාරණත්තා ජාණුමණ්ඩලතො හෙට්ඨා චතුරඞ්ගුලමත්තං ඔතාරෙත්වා අනාලම්බෙත්වා පරිමණ්ඩලමෙව පාරුපිතබ්බං, යනුවෙන් මේ ශික්ෂා පදයෙහිද පරිමණ්ඩල ශික්ෂාපදයට සාධාරණ බැවින් දණමඬලින් යට සතරඟුලක් පමණ සිවුර බහා කොන් නොඑල්වා වට සමව මණ්ඩලාකාරයෙන්ම පෙරවියයුතු වන්නේ යයි දක්වූහ.

ගණ්ඨිකං පටිමුඤ්චිත්වා කත්වා කොණෙ උභො සමං
ඡාදෙත්වා මණිබන්ධං වගන්තබ්බං ගීව මෙවච
තථා අකත්වා භික්ඛුස්ස ජත්තුතිපි උරම්පිච
විවරිත්වා යථාකාමං ගච්ඡතො හොති දුක්කටං

මෙහිදු අභිප්‍රාය නම් පාසයෙහි ගණ්ඨිය ප්‍රවේශ කොට දෙකොණ සමකොට මණි බන්ධයද ග්‍රීවයද වසා යායුතුය එසේ නොකොට ජත්‍රැවයද හෘදයද නොවසා කැමතිවූ පරිද්දෙන් යන්නාවූ භික්ෂු හට ආපත්තිවන බව දක්වූහ.

මෙහි ටීකාවෙහිද “උභො කණ්ණෙ සමං කත්වාති සම්බන්ධො ගීවමෙවච අනුවාතන්ත ඡාදෙත්වාති යොජනා, තථා අකත්වාති යථාවුත්ත විධානං අකත්වා ජත්තුතිපීති උභො අංසකූටානිපි උරම්පිචාති හදයම්පි විවරිත්වාති අපටිච්ඡාදෙත්වා යථාකාමං ති ඉච්ඡානුරූපං ගච්ඡතොති එත්ථ අන්තරඝරෙයි සෙසො අන්තරඝරං නාම ගාමොවා හොතු විහාරෙවා පවිසිත්වා භුඤ්ජිත්වා ගිහීනං වසනට්ඨානං” මෙයින්ද යථොක්තාර්ථම ප්‍රකාශවන්නේය. “තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡන්ති භගවතො එතමත්ථං ආරොචෙසුං “පෙ” න භික්ඛවෙ කායං විවරිත්වා අන්තරඝරෙ ගන්තබ්බං “පෙ” යො අනාදරියං පටිච්ච කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡති ආපත්ති දුක්කටස්ස, යනුවෙන් ෂඩ්වර්ගික භික්ෂූන් කාය විවෘත කොට නොහොත් එකාංශ කොට පොරවා ඇතුළුගමෙහි හැසිරුණ බව බුදුරජානන් වහන්සේට සැලකළ කල්හි එසේ නොගිය යුතුයයි වදාරා මේ ශික්ෂාපදය පනවා වදාළ බව මෙයින් ප්‍රකාශිත වන්නේය.

තදනන්තරව ඇතුළුගම නිසීදනය පිණිස පනවා වදාළ සතරවෙනි ශික්ෂාපදයෙහි විභාග නම්:—සුපටිච්ඡන්නො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛාකරණීයා, යන මේ දෙශනා පාලියෙහි අර්ථ විස්තර කොට දක්වන අටුවාචාරීන් වහන්සේ විසින්:- “චතුත්ථ සික්ඛාපදෙ හලවාටකභෙදො පණ්ණය සීඝං මණිබන්ධතො

පට්ඨාය සීසං මණිබන්ධතො පට්ඨාය හත්ථෙ පිණ්ඩිකමංසතො පට්ඨාය පාදෙ විවරිත්වා නිසීදිතබ්බං, යනුවෙන් ගලවළයෙන් උඩ හිසද මණි බන්ධයෙන් පාත දෙඅතද පිඩුමසින් පාත දෙපයද යන මෙකී පංචස්ථානය නොවසා සෙසු තැන් වසා පොරවා අන්තර ඝර යෙහි හින්ද යුතුයයි දැක්වූහ. පුනපි. චතුත්ථෙ ගලවාටකතො පට්ඨාය සීසං මණිබන්ධතො පට්ඨාය හත්ථෙ පිණ්ඩික මංසතො පට්ඨාය පාදෙ විවරිත්වා සෙසං ඡාදෙත්වා නිසින්නො සුපටිච්ඡන්නො නාම හොති. එත්ථ පන වාසූපගතස්ස අනාපත්ති" යන මෙහිද මුලකී පංචස්ථාන යන් නොවසා සෙසු තැන් වසා පොරවා හුන්නේ සුපටිච්ඡන්න නම් වන්නේය. මෙහි වනාහි වාසයට උපගතවූවාහට අනාපත්තිවන් නේයයි දැක්වූහ. "වාසූපගතස්සාති වාසත්ථාය උපගතස්ස රත්තිභාගෙ වා දිවසභාගෙවා කායං විවරිත්වා නිසීදතො අනාපත්ති" යනුවෙන් වාසය කිරීම පිණිස අන්තරඝරයට එළඹියා හට රාත්‍රි භාගයෙහිද දිවාභාගයෙහිද කාය විවෘත කොට හෙවත් එකාංශකොට පෙරවා ගෙණ හිඳිනා හට අනාපත්තියයි දක්වනලදී.

නැවතද

ගලවාටකතො උද්ධං සීසංච මණිබන්ධතො
හත්ථෙ පිණ්ඩිකමංසම්හා හෙට්ඨා පාදෙ උභොපිච
විවරිත්වා වසෙසං ච ඡාදෙත්වා වෙ නිසීදති
හොති සො සුපටිච්ඡන්නො දෙසො වාසූපගස්සත

මෙයිනුදු සුපටිච්ඡන්න පාරුපන යෙහි ලක්ෂණ විශේෂයෙන්ම ප්‍රකාශ වන්නේය.

"දෙසො වාසූපගස්සාති එත්ථ කායං විවරිත්වා නිසීදතොති සෙසො, වාසූපගො නාම රත්තිං වාසත්ථාය උපගතො, එතෙන වාසත්ථාය අන්තරඝරං උපගච්ඡන්තෙනාපි සුපටිච්ඡන්නෙනෙව උපගන්තබ්බන්තිපි වුත්තං හොති"

යනුවෙන් වාසයට එළඹීමනම් රාත්‍රියෙහි විසීම පිණිස පැමිණීමය එහෙයින් වාසයපිණිස අන්තරඝරයට එළඹෙන්නහු විසින්ද සුපිළිසත්වහෙවත් දෙවුරවසා පොරවා ගැටවට්ටුකරගෙණම එළඹිය යුතුයයි කියා මෙයින් ප්‍රකාශවනලද්දේවෙයි. පුනපි:-

"වාසත්ථාය උපගතස්සාතිහි වුත්තත්තා වාසාධිප්පායං විනා ධම්මදෙසනාපරිත්තභණනාදි අත්ථාය ඝරං සුචිරම්පි නිසීදන්තෙන සබ්බං අන්තරඝරවත්තං පූරෙන්තෙනෙව නිසීදිතබ්බං,, යනුවෙන් වාසයට එළඹියාහට අනාපත්තියයි වදාළබැවින් වාසයකරණ අභිප්‍රාය හැර බණකීම්පිරිත්කීම්ආදිය පිණිස අන්තරඝරයෙහි බොහෝවේ

ලාවක් හිඳින්නහු විසින්ද සියලුම අනන්තරසරවත් පූරම්ත්හින්ද යුතුයයි දක්වූහ.

"නිසීදනපටිසඞ්ඛෙනෙතසු එව සිඝාබාපදෙසු වාසූපගතස්සාති අනාපත්තියා වුත්තත්තා වාසත්ථාය අනන්තරසරං උපගච්ඡන්තෙනාපි සුපටිච්ඡන්නතාදිසබ්බං අකොපෙන්තෙනෙව ගන්තබ්බං,, යනමෙ සින්ද ඇතුල්ගමට යන්නහුවිසින් ගැටවටුගන්වා සුපිළියන්ව යා යුතු බවම හැඟෙන්නේය "වාසූපගතස්සාපි වුත්තං න උපගච්ඡන්තස්සාති,, යනමෙහි අභිප්‍රායනම් වාසයපිණිස අනන්තරඝරයට පැමිණි පසු විහාරයෙහිමෙන් එකාංශකොට පොරවාගෙණ හිඳිනාහට අනාපත්තියයි ප්‍රකාශකළාවිස වාසයපිණිස එහි පැමිණෙන්නාහට අාපත්තිනැතැයි නොකියනලද බැවින් වාසය පිණිස යනකල්හි එකාංශකොට පෙරවාගෙණ නොයාස් ගැටවටුගන්වා සුපිළියන් වම යායුතුබව ප්‍රකාශවන්නේය.

"කෙචි පන එකෙකම්හි පඨමං ගන්ත්වා වාසපරිග්ගහෙ කතෙ තතොඅඤ්ඤෙසු යථාසුඛං ගන්තුං වට්ටතීති වදන්ති අපරෙපන ගෙහසාමිකෙහි යාව තුම්හෙ නිවසිස්සථ තාව තුම්හාකං ඉමං ගෙහං දෙමිහි දින්නෙ අඤ්ඤෙහි ආවාසාධිප්පායෙහිපි අන්තරාරාමෙවිය යථාසුඛං ගන්තුං නිසීදිතුං ච වට්ටතීති වදන්ති තං සබ්බං න ගහෙතබ්බං තථාවචනාභාවා දුතලක්ඛණාභාවා. තාවකෙන විහාරසංඛ්‍යංනුපගමනතොච යාවනිසීදිස්සථ තාව තුම්හාකං ඉමංගෙහං දෙමීති දෙන්නෙනාපිහි තාවකාලිකං දෙති වත්‍ථුපරිච්චාගලක්ඛණත්තාදුනස්ස,,

මෙහි අභිප්‍රායනම්, අනන්තරඝරයෙහි වාසයපිණිස එකීඑකී කෙනෙක් පළමුකොටගොස් තමතමන්ට වාසස්ථාන අයිතිකරගත් කල්හි පසුවයන අනිකුත් භික්ෂූන් විසින් සැපවූ පරිද්දෙන් යන්ට වටනේයයි සමහර ආචාර්‍ය්‍යකෙනෙක් කියන්නාහුය නැවතද යම් තාක් නුඹවහන්සේලා වාසයකරවද ඒතාක් අපගේ මේ ගෘහය නුඹවහන්සේලාට දෙමියිකියා ගෘහස්වාමීන් විසින් දුන්කල්හි ආවාසාධිප්‍රායෙන් යන් නාවූ සෙසු භික්ෂූන්විසින්ද ආරාමය ඇතුළෙහිමෙන් සැපසේ යන්ටද සැපසේ හිඳින්ටද වටනේයයිකි යාත් සමහර ආචාර්‍ය්‍යයෝ කියන්නාහුවෙති ඒ සියල්ලම නොගතයුතුයි. කුමක්හෙයින්ද එබඳු කියමනක් නැතිහෙයිනුත් ඒ ප්‍රකාර දීමක ස්වභාවකුත් නැතිහෙයින්ය යම්තාක් වැඩහිඳිනහුනම් ඒ තාක් නුඹවහන්සේලාට මේ ගෘහය දෙමියිකියා දෙනතැනැත්තා තාව කාලිකකොට දෙනහෙයින් එපමණකින් විහාර සංඛ්‍යාවට නොයන හෙයින් සුපිළියන්නොවයාමෙන් දෝෂවනබව දක්වූහ

තවද "කෙචි අඤ්ඤාතකවිඤ්ඤත්තිසික්ඛාපදෙ අනාපත්ති—පෙ— ඉමස්මිං පාඨෙ යථාසුඛං නිසීදිතබ්බං නිපජ්ජිතබ්බන්ති වුත්තත්තා ගණ්ඨිකං අපටිමුඤ්චිත්වා යථාසුඛං නිසීදනං නිපජ්ජනං පන නාපි —පෙ—පවාරිතගෙහෙ යථාසුඛං නිසීදිතබ්බං නිපජ්ජිතබ්බන්ති වුත්තවචනසාමඤ්ඤත ගණ්ඨිමොචෙතබ්බාති ගණ්ඨිතස්ස —පෙ—වාසූපගතස්ස අනාපත්තීති වුත්තත්තා හත්ථකිච්චගිලානපච්චයමාපන්නො වාසූපගතොති වදන්ති තථා භවෙය්‍ය සුපටිච්ඡන්න සික්ඛාපදං නිප්පයොජනං භවෙය්‍යාති ඉදම්පි න යුජ්ජති තස්මා අඤ්ඤාතකවිඤ්ඤත්ති සුපටිච්ඡන්නසික්ඛාපදානං අවිරුද්ධත නියාමෙන විනිච්ඡයො වෙදිතබ්බො,, යනුමෙහි සංක්ෂෙපවශයෙන් අගීප්‍රාස නම් සමෙක් තමාගේ ගෘහය භික්ෂූන්ට පවරමියි කියා පැවරූපසු ඒ ගෘහයට පැමිණි භික්ෂූන් විසින් සැපසේ හින්දයුතුය සයනයකළ යුතුයයි කියනලද බැවින් ගැටවටුව නුමුදා සැපසේ ඉන්ටද සැත පෙන්ටද නොහැකිසෙයින් ගැටවටුව මිදීමෙහි දෝෂනැතැයි සමහර කෙනෙක් කියති ඒඇර වාසූපගතයාහට ඇවැත්නැතැයි වදාළබැවින් දත්වැලදීම් ගිලන්පස වැලදීම් ආදිකටයුතු පැමිණිකල්හි ගැටවටුව මිදීමෙන් වරදනැතැයිකියාත් සමහරෙක් කියත්තාහුය එසේවීනම් සුපටිච්ඡන්න ශික්ෂාපදය නිෂ්ප්‍රයෝජනවන්නේය එහෙයින් අඤ්ඤාතකවිඤ්ඤත්ති සුපටිච්ඡන්න ශික්ෂාපදවලට අවිරුද්ධවූපරිද්දෙන් මෙහි විභාගදතයුතුයයි දක්වනලද්දේය "අනාපත්තිවාරෙ අනාගතත්තා ගණ්ඨිමොචනං බහුන්නං සමාරොපිතානි,, යනුවෙන් අසංචිච්ච අසතියා යනාදී අනාපත්තිවාරයෙහි නොආබැවින් ගැටවටුවමිදීමෙහි බොහෝවූ දෝෂකියත්තාහුයයි දක්වූහ.

තථා අසංචිච්ච අසතියා අජානන්තස්ස ගිලානස්ස වාසූපගතස්ස ආපදාසු උම්මත්තකස්ස ඛිත්තචිත්තස්ස වෙදනට්ටස්ස ආදිකම්මිකස්සාති ඉමෙ දස අනාපත්තිවාරා.

යනුවෙන් මෙහි ප්‍රකාශවනලද දසදෙනාහට ආපත්ති සිඬනොවනබව දතයුතුයි. මෙසේ සෙඛියාවෙහි දක්වනලද තුන්වෙනි සතරවෙනි සුපටිච්ඡන්න ශික්ෂාපදවලයෙහි විභාගමදක් සංක්ෂේපයෙන් ගෙණහැරදක්වා තදනන්තරව දෙවුරවසා පෙරවා ගැටවටුකිරීම සඳහා දැනට මේරවටි සමහර තෙරුන්වහන්සේලා විසින් උපදවනලද වාදකථාවත් ගැණත් මදක් කරුණු මෙහි ගෙණහැරදක්වත් තෙමි ඒ වාදකථාවල් නම් කවරහුද? බුදුරජාණන්වහන්සේ බුදුවීමට ප්‍රථමයෙන් මහාබ්‍රහ්මයා විසින් දෙනලද අටපිරිකර පිළිගෙණ පැවිදිවෙස් ගැණීමෙහිදී එකාංශ කොට පෙරවූබව ප්‍රකාශිත බැවිනුත් වෙනත් කාරණයන් කරණකොට ගෙණ එකාංශකොට පෙරවා ගැටවටුකිරීමහරිවාම්ස දෙවුරවසා ගැටවටුකිරීම වැරදිය කියන

ම්පළමුවෙනි වාදකථාවය. දෙවුරවසා ගැටවවුකිරීම නිසීදන
සටම්සගමනට වැරදිය කියන මේ දෙවෙනි වාදකථාවය. දෙවුරවසා
ගැටවවුකරගෙණපාත්‍රය අතින් නොගෙණයාමවැරදියකියන මේතුන්
වෙනිවාදකථාවය. දෙවුරවසා ගැටවවුකිරීම නියමකරවදාලේ පිණ්ඩ
පාතයට මිස වෙනයම්කාරුණක් ගැන නොවේය කියන මේ සතර
වෙනි වාදකථාවය. දෙවුරවසා ගැටවවුකිරීම සාමණේරතැන්ට හරි
නැතකියන මේ පස්වෙනි වාදකථාවය.

මෙහිදක්වූ මේ පංචවිධ වාදකථාවන් අතුරෙන් දෙවුරවසා ගැ
ටවවුකිරීම වැරදිය කියන පළමුවෙනි වාදකථාවගැණ මාවිසින්
දෙනලද ප්‍රත්‍යුත්තරනම් මෙහි ඉහත දක්වනලද සුපටිච්ඡන්නා ශි
ක්ෂාපදවර්ණනාවලින් දෙවුර වසා ගැටවවුකිරීම ඇත්තක්බව
අතිපවිත්‍රලෙස ප්‍රකාශවනසෙයින් ඒ පාලිවගනාහි නැවත නැවතත්
ගෙණ හැරදක්වීම කරණකොටගෙණ වාසගම් දිඝීවීමෙන් සැපසේ
ශ්‍රවණධාරණදෙක නොකොට හැකිබැවින් පළමුදක්වූ වගන්ති
තොලියා එයින් අන්‍යවූ උදහරණයන් මෙහි දක්වමි.

"කායං විවරිත්වාති ජත්තුම්පි උරම්පි විවරිත්වා කායං විවරිත්වා
නිසීදනොපි විහාරෙවිය එකංස පාරුපනං සන්ධායවුත්තං,, යනුවෙන්
මෙහිදක්වූ 'කායං විවරිත්වා' යන දෙශනාපදය විස්තරකරණ අටුවා
චාරීන් වහන්සේ අංශකූටයද හෘදයද නොවැසීම කායවිවෘතකිරීම
යයි දක්වූහ. සත්ත්වයාගේ හිසපටන් දෙපතුලදක්වා සියලු ශරීරය
ටම කායයනනාමය ව්‍යවහාරවෙනනුමුත් නිසීදන සුපටිච්ඡන්නා පා
රුපනයෙහි ලක්ෂණදක්වූ ස්ථානයෙහි නොවසාතබන්ට නියමකළ
පංචස්ථානය හැරවසන්ට නියමකළ ශරීරයාගෙන් ඉතා ස්වල්පප්‍රදෙ
ශයක්වත් නොවසා ඉතුරුවුනේවීනම්ඒ කායවිවෘතකිරීම නම්වෙයි
එසේ ඇතිකල්හි එකාංශකොට පෙරවීමෙන් දකුණු අංශකූටය සහ
දකුණුහස්තයද හෘදයෙන් අඩක් සහ ග්‍රීවයද ප්‍රතිච්ඡාදනය නො
වනබැවින් ඒ පෙරවීම සුපටිච්ඡන්නපාරුපනයක් නොවනබව නුව
නැණ කාටනම් නොහැගේද ඇරත් උන්වහන්සේලාගේ කීමේ
ප්‍රකාරයට සුපටිච්ඡන්න ශික්ෂාපදය නිෂ්ප්‍රයෝජනවෙන්ට ඕනැය
මක්නිසාද එකාංශකොට පෙරවා ගැටවවුකිරීමෙන් කායවිවෘතය
ක් නැතකියන නිසාය බොහෝකොටකීමෙන් ප්‍රයෝජන කවරේද?

කායවිවෘතකොට ගිදීමනම් විහාරයෙහි මෙන් එකාංශපාරු
පනය සඳහා කියනලදුයි යන මේ පාඨයෙන්ම දෙවුරවසා පෙර
වීම හරිබව දතයුතුයි යලිදු ගීවෙය්‍යක ජංඝෙය්‍යක බාහ
න්තාදීන්ගෙහි ලක්ෂණ ප්‍රකාශවූ ස්ථානවල්හි ගීවෙය්‍යකනම් ග්‍රීවය
වෙලන ස්ථානයෙහි සිවුරු දුම්ලු නොවනලෙස දැඩිකිරීම පිණිස

හුයින් මසනලද අන්‍යවූ ආගන්තුක පත්‍රයකැයි කියාතිබෙන සෙයින් ඒකාංශයෙපරවීමට ග්‍රීවය හාත්පසින් පිළිසත් නොවන බැවින් ග්‍රීවය වෙළන ස්ථානයෙහියයි දක්වූ වචනයත් නිෂ්ප්‍රයෝජනබවහැඟෙන්නේය "ගිවෙය්‍යකන්ති ගීවාවෙඨනඨානෙ දළ්හකරණත්ථං අඩ්ඪදං සුත්තසංසිබ්බිතං ආගන්තුකපත්තං" යනු ග්‍රීවෙය්‍යකයෙහි ලක්ෂණයිතවද ඒකාංශගැටවවටූව සුප්‍රතිච්ඡන්නපාරුපනය නොවනබව ගණ්ඨිපාසදෙක අනුදැන වදාළකාරණය පරීක්ෂාකොට බලන්නාහට ඉතා පිරිසිදුව හැඟෙනවා ඇත කෙසේද? උත්තරාසංගයත් සංඝාටියත් සගුනකරපෙරවා ගම්හි ගම්හි හැසිරෙනකල්හි සුළඟින් සිවුර ලිහිල්ව නොයනපිණිස ගණ්ඨිපාසදෙක අනුදැන වදාළාමිස ඒයින් ශරීරය ප්‍රතිච්ඡන්න නොවනබව මේමතු කියනප්‍රකාරයෙන් දැනගතයුතුයි,, තෙන ඛො පන සමයෙන ආයස්මා ආනන්දො ලහුකා සංඝාටියො පාරුපිත්වා ගාමං පිණ්ඩාය පාවිසි වාතමණ්ඩලිකාය සංඝාටියො උක්ඛිපියිංසු අථ ඛො ආයස්මා ආනන්දො ආරාමංගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං, අනුජානාමි භික්ඛවෙ ගණ්ඨිකපාසකංති තෙන ඛො පන සමයෙන භික්ඛූ ගණ්ඨිකම්පි පාසකම්පි චීවරෙ අප්පෙන්ති චීවරං ජීරති භගවතො එතමත්ථං ආරොචෙසුං අනුජානාමි භික්ඛවෙ ගණ්ඨිකඵලකං පාසකඵලකන්ති ගණ්ඨිඵලකම්පි පාසඵලකම්පි අනෙන්ත අප්පෙන්ති කොණො විවරීයති භගවතො එතමත්ථං ආරොචෙසුං අනුජානාමි භික්ඛවෙ ගණ්ඨිකඵලකං අන්තෙ අප්පෙතුං පාසඵලකං සත්තංගුලංවා අඩ්ඪංගුලං ා ඔගාහෙත්වා අප්පෙතුන්ති.

යනමෙයින් ගණ්ඨිපාසදෙක අනුදත් අර්ථය සහ සිවුරෙහි ගණ්ඨිපාස බඳින්ට නියමකළ ස්ථානද ප්‍රකාශවන්නේය තවද දෙවුරවසා පෙරවීම සුපටිච්ඡන්න පාරුපනයබවට අතිකුදු උදාහරණයක් දක්වමි.

'අථ ඛො ආයස්මතො සුදින්නස්ස ඤාතිදාසී තං ආභිදොසිකං කුම්මාසං ආයස්මතො සුදින්නස්ස පත්තෙ ආකිරන්ති හත්ථානං ච පාදානං ච සරස්ස ච නිමිත්තං අග්ගහෙසි,, යනමෙහි අභිප්‍රාය නම්, ඉක්බිති ආයුෂ්මත් සුදින්න ස්ථවිරයන්වහන්සේගේ ඤාතිදාසීතොම ඒපිළිතිවූ කොමුපිඩු ආයුෂ්මත්සුදින්න ස්ථවිරයන්වහන්සේගේ පාත්‍රයෙහි බහාලන තැනැත්තී හස්තයන්ගේද පාදයන්ගේද ස්වරයාගේද නිමිත්තග්‍රහණය කළාය.

මෙහි අටුවාවෙහි

හත්ථානන්ති භික්ඛං ගණ්හනත්ථාය පත්තං උපනාමයතො මණිබන්ධතොපපභුතිවින්නම්පි හත්ථානං, පාදානන්තිනිවාසනන්තතො පට්ඨාය විත්තතම්පි පාදානං, සරස්සාති සචෙ තං භගිනීති වාචං නිච්ඡාරය

තො සරසසව නිමිත්තං අග්ගහෙසීති ගිහිකාලෙ සල්ලක්ඛිතපුබ්බං ආකාරං අග්ගහෙසි,,යි යනුවෙන් භික්ෂුව පිළිගන්නාපිණිස මදක් නැඹුරු කරණලද පාත්‍රය ඇති උන්දිගත්සේගේ මණිබන්ධය පටන් හස්තයන් දෙදෙනාගේද නිවාසනාන්තය පටන් පාදයන්දෙදෙනාගේද ඉදින් නැගනියයිකියා කරනලද කථාඇති උන්වහන්සේගේ ස්වරයාගේද නිමිත්ත ගත්තීය නොහොත් ගිහිකාලයෙහි සලකණලදවිරු ආකාරගත්තීය.

ටීකාවෙහිද

'හත්ථපිඩි ආදීනි ඔලොකයමානා සාමිපුත්තස්ස මෙ සුදින්නස්ස කවඡපටිඝසදිසා ඉමා හත්ථපාදපිඩියො හරිතාලවට්ටියො විය සුවට්ටියො තා අඞ්ගුලියො මධුරා සරොති ගිහිකාලෙ සල්ලක්ඛිතපුබ්බං ආකාරං අග්ගහෙසි සංජානි සල්ලක්ඛෙසි,, යනුවෙන් පූර්වෝක්තක්‍රමයෙන් හස්තපාදවයවයන්ගේ ලක්ෂණ සොයා ඇදිනගත් බව ප්‍රකාශිතයි මේ උදාහරණයෙහි ප්‍රකාශවන මණිබන්ධයෙහි පටන් හස්තයන්දෙදෙනාගේද යන පදයෙන් දෙවුරවසා පෙරවීමහරිබව පවිත්‍රලෙස හැඟෙන්නේය.

නැවතත් උදාහරණයක් දක්වමි ''මහාපුරිසො තුය්හං තාව දනස්ස දින්නභාවෙ සචෙතනා සක්ඛිනො—පෙ—අයං අචෙතනාපි ඝණමහා පඨවි සක්ඛීති චීවරගබ්භන්තර තො දක්ඛිණහත්ථං අභිනීහරිත්වා—පෙ—මාරබලං අවත්ථරමානා විය උන්නදි,, මෙහි අභිප්‍රායනම් මහාපුරුෂයාණන් වහන්සේ ලොවිතුරා බුදුබවටපැමිණීම පිණිස වජ්‍රාසනාරූඪව වැඩඋන්කල්හි වසවර්තිමාරයා බුදුවිය නොදෙමිකියා මරසෙනග පිරිවරාඅවුත් යුද්ධකොට කිසිවක්කළ නොහී දෙවනුව ඒපය්‍යඞ්කය තමාහට අයිතිබවට මරසෙනගලවා දෙස්කියවූකල්හි මහාපුරුෂොත්තමතෙම තමන්වහන්සේ ඒ පය්‍යඞ්කය උදෙසා වෙසසන්තරාත්මභාවයෙහිදී සප්තසතක මහාදනයක් දුන් බවට මේ ඝණකඩ මහපොළොව සාක්ෂිවන්නීයයි කියා සිවුරුගැබ අතරෙන් දකුණු ශ්‍රී හස්තය මොනවට නිකුත්කර වෙසතුරු අත්බැව්හි සිට දුන්නාවූ මාගේ දනයට තී සාක්ෂිද නැද්දැයි කියා මහාපෘථිවිය දිශාවට ශ්‍රී හස්තය දිගු කළසේක. එකල්හි මහාපෘථිවිතොමෝ නුඹවහන්සේ ඒ දුන් දනයට මම සාක්ෂිමියි කියන්නියකමෙන් ශතරාව සහස්‍රරාවයෙන් ගුගුරා පැනනැංගීය.,, මෙහිද ''චීවරගබ්භ අතරෙන් දකුණු ශ්‍රී හස්තය නිකුත්කොට,, කියන මේ වචනය කාරණකොටගෙණ දෙවුරවසා පොරවා එහි වැඩඋන් බව නිශ්ශංකාව හැඟෙන සෙසින් දෙවුරවසා පෙරවීම හරිබව මෙයිනුත් ප්‍රකාශවන්නේමැයි..

ඒගැණ තවත් උදාහරණයක්දක්වමි. "සුවණ්ණවණ්ණංකායං විවරිති න සබ්බකායං විවරි බුද්ධානාම ගණ්ඨිකං පටිමුඤ්චිත්වා පටිච්ඡන්නා සරීරා පරිසතිං ධම්මං දෙසෙන්ති අථ භගවා ගලවාටක සම්මුඛට්ඨාන චීවරං ගහෙත්වා චතුරඞ්ගුලමත්තං ඔතාරෙසි" යන මෙහි අභිප්‍රායනම් සච්චකයන් විශාලාමහනුවර වැසියන් හා සමග බුදුන්කරාගොස් වාදකොට පරාජයටපැමිණ බුදුන්ගේ ඇසීමට ප්‍රත්‍යුත්තරනොදී තුෂ්ණීම්භූතව ඉන්නාකල්හි ශක්‍රයාවිසින් භයගන්වනලදුව ඔහුගේ සකලශරීරයෙන් ඩහදියවැගිරෙන්ට පටන්ගත්කල ඒබවදුටු මහජනයා බුදුරජානන්වහන්සේ වනාහි ඝන දෙපටසිවුර පොරවා ගැටවිටුකර වැඩඋන්සෙයින් උන්වහන්සේගේ ශරීරයෙහි ස්වේදඇතිනැතිබව කෙසේ දැනගන්ට හැකිදැයි සැකකලකල්හි ඒ මහජනයාගේ සැකදුරුකරණ පිණිස බුදුරජානන්වහන්සේ සුවණ්ණවණ්ණවූ ශරීරය විවෘතකර වදාළසේක. ඒ බව විස්තරකරණ අට්ඨකථාචාරීන්වහන්සේ මෙසේ දක්වූහ. බුදුහු සකලශරීරය විවෘතකළානොවේය. බුදුවරයන්වහන්සේලා වනාහි ගැටවටුගත්වා සුප්‍රතිච්ඡන්නශරීරයඇතිව පිරිසට ධර්මදේශනාකරන්නාහුවෙති. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ ගලවළවට සම්මුඛස්ථාන චීවරයගෙණ සතරඟුලක් පමණ පාතටබහාලූසේක. එකල්හි ශ්‍රී ශරීරයෙන් රන්වන් බුදුරුස්නික්ම ආකාශයෙහි විහිදගියාහුය. යනමේ උදාහරණයගැණ ඒකාංශනැටවටුව ස්ථිරකරන්ට උත්සාහකරන්නාහු බොහෝසෙයින් එඩිතරව කථාකරන්නාහුය ඒ කථාවෙන් කිසිම ප්‍රයොජනයක් නොවන්නේය.

නැවතද බුද්ධාගම පවත්නාවූ ස්‍යාම් අමරපුරාදිනොයෙක් දෙශවාසී සංඝයාවහන්සේලා අතරෙහිසහ ලංකාවාසී සංඝයාවහන්සේලා අතරෙහිද පුරාණකාලයෙහි පටන් දෙවුරවසා ගැටවටුකිරීම පවත්වාගෙණ එනසෙයිනුත් දෙවුරවසා ගැටවටුකිරීම සුපටිච්ඡන්නපාරුපනය බව දතයුතුවත්ඇර ඒකාංශකොට පෙරවා ගැටවටුකිරීම සුපටිච්ඡන්නනමැයි කියන වචනය ධර්මවිනය දෙකට විරුද්ධවූ අත්තනොමති කියමනක්බව දැනගතයුත්තේය. තවද,

දෙඋරවසා ගැටවටුකිරීම නිසීදනයට පමණක්මිස ගමනට හරිනැතකියන මේ දෙවෙනි වාදකථාවගැණ දෙන ප්‍රත්‍යුත්තර නම් "තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡන්ති භගවතො එතමත්ථං ආරොචෙසුං "පෙ" න භික්ඛවෙ කායං විවරිත්වා අන්තරඝරෙ ගන්තබ්බං "පෙ" යො අනාදරියං පටිච්ච කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡති ආපත්ති දුක්කටස්ස,, මේ දෙශනා පාළියෙහි ක්‍රමයෙන් සහ මෙහි මුලදීදක්වනලද

සියලුම ශික්ෂාපදවණ්ණනාවලින්ද ගැටවටුකිරීම ගමනට ඕනෑ බව නිරවශෙෂයෙන්ම ප්‍රකාශවන්නේය. ඒඇර

අන්තරඝරවතෙහි පනවාවදල තවමවනි ශික්ෂාපදයෙනුත් අන්තරඝරයෙහි ගමනට ගැටවටුව ඕනෑබවම හැගෙන්නේය. කෙසේද?

“න උක්ඛිත්තකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා,, මෙහි අභිප්‍රායනම් එක අංශයකින්හෝ දෙඅංසයෙන්හෝ සිවුර උඩටනගාලීමෙන් යුක්තව ඇතුළුගම්හි නොයායුතුය යනබවයි. එහි අභිවිස්තරකරණ අටුවාචාරීන්වහන්සේ විසින්ද:-නවමෙ “උක්ඛිත්තකායාති උක්ඛෙපෙන ඉත්‍ථම්භූතලක්ඛණෙ කරණවචනං, එකතො වා උභතො වා උක්ඛිත්තචීවරො හුත්වාති අත්‍ථො, අන්තො ඉන්ද ඛීලතො පට්ඨාය එවං නගන්තබ්බං,, යනුවෙන් මුලකීක්‍රමයට උඩට නගනලද සිවුරෙන් යුක්තව ගම්දොරඇතුළු ඉන්ද්‍රඛීලයෙහි පටන් නොයායුතුයයි දක්වනලදී. මෙහි අන්තරඝරශබ්දය ඇතුළුගමටද ඇතුළුගෙටද කියවෙනසෙයින් ගමනනිසීදනදෙක උදෙසා අන්තරඝරවතෙහි දක්වනලද සවිසිශික්ෂාපදයෝම ඇතුළුගමෙහිද ඇතුළු ගෙහිද නොකඩව පිළිපැදියයුතුවන්නාහුය ඒබව. අන්තඝරනාති කච්චි නගරවාරස්ස බහිඉන්දඛීලතො පට්ඨාය අන්තොගාමො වුච්චති කච්චි ඝරුම්මාරතො පට්ඨාය අන්තොගෙහං,, යනමෙයින් ප්‍රකාශවන්නේය. පුනපි, උක්ඛිත්තචීවරො හුත්වාති කටිතො උබ්භං කායබන්ධනාදි දස්සනවසෙන උක්ඛිපනං සන්ධායවුත්තං පිණ්ඩාය චරතො පත්තගහණාදිමත්තස්ස අනුඤ්ඤාතත්තා තෙනෙව නිසින්නකාලෙ ධම්මකරකංති ආදිවුත්තං, නිසින්නකාලෙහි බන්ධිලග්ගපත්තත්‍ථවිකාදිතො ධම්මකරකං නීහරන්තස්ස කටිතො උබ්භම්පි දිස්සති. තථා අදස්සෙත්වා නීහරිතබ්බන්ති අධිප්පායො; යනුවෙන් උඩටනගනලද සිවුරෙන් යුක්තවයයි කීයේනම් කටිප්‍රදෙශයෙන් උඩ කායබන්ධනාදිය දක්නාවශයෙන් උක්ෂිපනය සඳහා කියන ලද්දේය. පිඬුපිණිස හැසිරෙන්නාහට පාත්‍රය ගැණිම්ආදිය පමණ කට අනුදත්බැවින් උත්කල්හිද උරෙහිඑල්වනලද පාත්‍රත්‍ථවිකාදියෙන් ධමකරාවනිකුත්කරන්නාහුගේද කටිප්‍රදෙශයෙන් උඩ ශරීරය පෙණෙනබැවින් එසේනොදක්වා නිකුත්කටයුතුයයි යන අභිප්‍රායයි. මෙහිදක්වූ “එකතො උභතො” යන පදම්යෙන් ප්‍රකාශවන්නේ දෙඅංශකූටයෙන් උඩට සිවුර නගාලීමවන්නේය. ඒබව අන්තරඝරෙ එකංසතොවා උභයංසතොවා චීවරං උක්ඛිපිත්වාගන්තුං නිසීදිතුංවනවට්ටති.—පුනපි—එකතොපීති එකඅංසකූටතොවා උභතොපීති උභය අංසකූටතොවා ඉන්දඛීලතො අන්තොති ගාමවාර ඉන්දඛීලතො “පෙ” ධම්මකරකාදිනුපි එසෙව නයො,

යනාදිවශයෙන් ගම්දෙර ඉන්ද්‍රඛීලයෙහි පටන් දෙවුරවසා පොරවා සුපිළිසන්ව ඇතුළුගම්හි යායුතුබව ප්‍රකාශවනසෙයින් දෙවුරවසා පෙරවීම ඇතුළුගෙයි නිසීදනයට පමණක්මයයි කියන ඒවචනය අපරීක්ෂාකාරිව කියන වචනයක්බවද දතයුතුයි. තවද දෙවුරවසා ගැටවවුකර පාත්‍රය අතටනොගෙණ කිසිමකරුණක් ගැණ ඇතුළුගමටයන්නට නුපුළුවන කියන මේ තුන්වෙනි වාදකථාව ගැණ උත්තරනම් භත්තාග්‍රවතෙහිද පිණ්ඩචාරිකවතෙහිද ආරඤ්ඤවතෙහිද යනමේ තුන්ස්ථානයෙහිම ගැටවවුකර සෝධා පාත්‍රය ගෙණ ඇතුළුගමට යායුතුයයි නියමකරතිබෙනවා සැබැවය එහි ක්‍රමනම් "සචෙ ආරාමෙ කාලො ආරොචිතො හොති තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සංඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා සාධුකං අතරමානෙන ගාමො පවිසිතබ්බො, යනුවෙන් ඉදින් ආරාමයෙහි කල්දන්වනලද්දේවේද එකල්හි තෙම ධුලුවසාහැඳ පටිය බැඳ සගුණකර සහළසිවුරුපොරවා ගැටවවු කොට සෝධා පාත්‍රය ගෙණ මනාකොට නොවෙලෙව්ව භික්ෂුහු විසින් ගමට ප්‍රවිෂ්ටවිය යුතුයයි වදාරණලද්දේය.

පිණ්ඩචාරිකවතෙහිද "පිණ්ඩචාරිකෙන භික්ඛුනා ඉදානි ගාමං පවිසිස්සාමීති "පෙ" ගාමො පවිසිතබ්බො,, මෙහිදු අපි පෙරසේමයි. මේ දෙතැන්හි "සචෙ ආරාමෙ කාලො ආරොචිතො හොති,, යනපදයෙන්ද "පිණ්ඩචාරිකෙන භික්ඛුනා,, යන පදයෙන්ද භත්තාග්‍රයට සහ පිණ්ඩපාතයටද යන භික්ෂූන්විසින් සෝධා පාත්‍රයගෙණ යායුතුබව ප්‍රකාශවෙනවාමිස මේ දෙකාරණයෙන් පිටත් අන්කිසිකරුණක්ගැණ එදවස්හිම ආරාමයට එනසංඝයාවෙත් ඇතුළුගමට යන්නාවූ භික්ෂූන්විසින් සෝධා පාත්‍රයගෙණ යායුතුයයි කියා පනවාපු ප්‍රඥප්තියක් දකින්ට ලැබුනේනැතුවත්ඇර ඒගැණ යම්වරදක් පැමිණෙනවානම් ඒකාංශකොට්පෙරවාගෙණ යන්නාවූ භික්ෂූන්වහන්සේලාටත් ඒවරද පැමිණෙන්ට ඕනෑය. මක්නිසාද පාත්‍රය අනුද්දූතවදුලේ දෙවුරවසා පොරවන භික්ෂූන්වහන්සේලාටම නොවන නිසාය. ඒඇර සුපටිච්ඡන්නශික්ෂාපදයාගේ ලක්ෂණදුක්වූ කිසිස්ථානයකවත් පාත්‍රය ඊට සම්බන්ධකර නැතිසෙයින් සුපිළිසන්නොව යාමහිදීම කාරණකොටගෙණ පැමිණෙන දෝෂය අනිකෙක පාත්‍රය නොගෙණයාමෙන් යම්දෝෂයක්වේනම් ඒ දෝෂය අනිකෙක මේ දෝෂදෙකම එකටසම්බන්ධකර දෙවුරවසා පොරවන භික්ෂූන්වහන්සේලා පිටතබා තමන් එයින් නිර්දෝෂ වෙන්ට කරන්නාවූ කථාව ධර්මානුකූලවූ කථාවක් නොවේය.

එසේහෙයින් මෙකීවරද දෙකක් එකටගලපාලා වරදනැති දේව කරන්නාවූ අධර්මකථාව සඳහා මේගැණ උත්තරලියන්ට ඕනැකලා මිස භික්ෂූන්වහන්සේලා යනඑන ස්ථානයකට පාත්‍රය ගෙණයාම ප්‍රතික්ෂෙපකරණ අභිප්‍රායකින් නොවෙය. බුද්ධාදිමහෝත්තමයන්වහන්සේලා පවා ගම්නියම්ගම් රාජධානියෙහි සැරිසරා වඩිනාකල්හි පාත්‍රය ගෙන්වායෙණ වැඩියබව ත්‍රිපිටකාදීයනීප්ති ධර්මයෙහි ප්‍රකාශව තිබෙනබැවිනුත් පාත්‍රය ගෙණයාම ශ්‍රමණයන්වහන්සේලාගේ චාරිත්‍රධර්මයක්නිසාත් තමන්වසන ආරාමයෙන් පිටත යම්ස්ථානයෙක්හි යටත්පිරිසෙයින් දවසක්වත් ප්‍රමාදවෙන අභිප්‍රායෙන් යන්නාහුවිසින් පාත්‍රය ගෙණයාම යුතුවන්නේමය.

තවද, සුපටිච්ඡන්න ශික්ෂාපදය පහවා වදාලේ පිණ්ඩපාතය වම මිස අන්කිසිස්ථානයකට නොවෙයිකියන සතරවෙනි වාදය ගැණ දෙන ප්‍රත්‍යුත්තරනම්? භත්තාග්‍රවත්තය පිණ්ඩචාරිකවත්තය ආරණ්‍යකවත්තය යනමේ තුන්ස්ථානයෙහිදීම සුපටිච්ඡන්නශික්ෂාපදය ප්‍රකාශවතිබෙන කාරණය හෙතුකොටගෙණ අපරීක්ෂාකාරීව එසේ කියනවාමිස ඒ සුපටිච්ඡන්නශික්ෂාපදයෙහි අර්ථවර්ණනාකර තිබෙන අටුවාටීකාප්‍රකරණ පොත්වලා ඒගැණ ප්‍රකාශකාරතිබෙන කාරණයන් සිහියෙන් යුක්තව පරීක්ෂාකලකල්හි ඒකීම සාවද්‍ය බැව් යථාස්වභාවයෙන්ම හැඟියනවාඇත එසේහෙයින් ඒගැණ වඩාදුරට කාරණයන් ගෙණහැරදක්වීමෙන් ප්‍රයෝජනයක් නැතත් ඒගැණ එකාව උදාහරණයක් මෙහිදක්වමි. කෙසේද? සෙඛියාවෙහි දක්වනලද පන්සැත්තැවක් ශික්ෂාපදයන් අතරෙන් අන්තරඝරයෙහි ගමන නිෂද්‍යදෙකළදෙසා සවිස්සක් ශික්ෂාපද නියමකරතිබෙනවාය එයින් සුපටිච්ඡන්නශික්ෂාපදය පමණක් පිණ්ඩපාතයෙන් පිටත් අන්‍යවූ කාලයකට නොවෙයිකියා නියමයක් නැතිබැවින් ඒ ශික්ෂාපදවිසිහයම ඇතුළුගම්හි ගමනනිසීදනා දෙක්හි සම්පූර්ණවම රක්ෂාකරන්ට යුතුබව හැහෙනවාය. එසේ නොව පිණ්ඩපාතවතෙහි ඒ ශික්ෂාපදයන්සියල්ලම දක්වාලා තිබෙනනිසා පිණ්ඩපාතයෙන් පිටත් අන්කාරුණක්ගැණ ඇතුළුගමටයන කල්හිද ඉඳිනාකල්හිද සුපටිච්ඡන්නශික්ෂාපදය කඩකලාම වරදක්නැතුවානම් අනිකුත් ශික්ෂාපදකඩකලාවත් වරදක් වෙන්ට නුපුළුවන මක්නිසාද ඒශික්ෂාපද විසිහයම අන්තරඝරවතෙහි දක්වාලූනිසාත් සුපටිච්ඡන්නශික්ෂාපදය වෙන්කරලා නැති නිසාත්ය, ඉඳින් විකාලග්‍රාමප්‍රවේශනාදියෙහි යම්භික්ෂුකෙනෙක් ඊනාකොටනොහැඳ නොපොරවා සුවිනීතනොව ඇතදුරබලබලා අතපය සොලව සොලවා දෙඅංසයෙන් හෝ එකාඅංසයකින් හෝ

සිවුර උඩටනගා මහත්වූ සිනාඇතිව බොහෝදුරඇසෙනලෙස මහත්කොට ශබ්දපවත්වමින් කයසලසලා ඉසසලසලා උකුලෙහි තබනලද අත්ඇතිව හිසවසාපෙරව අග්පතුලෙන් හෝ විළුඹෙන් හෝ යන්නාවූ ගමන්ඇතිව ඇතුළුගම්හි ගමන නිසීදනදෙකට යෙදුනෝවීනම් ඔහු උමතුකෙනෙකකියා සියල්ලෝම කල්පනාක රන්නාහු නොවෙද්ද? අතිශයින්ම එසේසිතන්නාහුවෙති. මෙහි කීප්‍රකාරයට ඇතුළුනවෙතිනබා දීඝීමාගීයෙහිවන් ශ්‍රමණයන් වහන් සේලාට යාවසරුප්නොවන්නේය. තවද, මේවාදකාරකතෙරුන් වහන්සේලා කියන්නාවූ මේකීම පෙර බුඩප්‍රත්‍යකබුඩආයයීශ්‍රා වකයන් වහන්සේලා අඩානමාගීයෙහි එකාංශකොට පොරවාගෙණ වැඩියබව ප්‍රකාශවතිබෙන නිසාදෙ කියාහැඟෙනවාය. අපිනුමුත් අඩානමාගීයෙහි යනවිට දෙළුරවසා පොරවාගෙණ යත්ටඹනැය කියා නොකියමින අඩානමාගීයෙහි පමණක්නොව අරණ්‍යමාගී යෙහිද සුපිළිසන්නොව යාමෙන් දෝෂනොවන්නේය, ඒබව ආ රණ්‍යවනෙහි සහ පිණ්ඩචාරිකවනෙහිද “ඉදුනිගාමං පවිසිසසාමි” යන පදයෙන් පැහෙන්නේය. ඒඇර දූනට සමහරභික්ෂූහු දෙවුර වසා පොරවාගෙණ ආරාමයට ඇතුල්වන්නාහුවෙති චෛත්‍යස්ථා නදකදකත් දෙවුරවසාගෙණ යන්නාහුවෙති. ඒ ස්ථානවයෙහිදී දෙවුරවසා පොරවාගෙණ යාම වරදබව ධම්විනයදෙක්හි ප්‍රකාශ වන්නේය. අපේකිමනම් ඇතුළුගම්හි කිසියම් කාරුණක්පිණිස නමුත් එනයහාවිට දෙවුරවසා පොරවා ගැටවටුගන්වාගෙණ ඊම යාම ඉදීම පමණකටමයි. එසේහෙයින් දෙවුරවසා ගැටවටුකිරීම පිණ්ඩපාතයටමිස වෙන කිසිකාලයකට නොවෙයිකියන ඒ වචනය ධම්විනය දෙකට ප්‍රතිවිරුඩවූ අන්‍යොන්‍යසංකරවචනයක්බව දැනගතයුතුයි.

තවද, දෙවුරවසා ගැටවටුකිරීම සාමණේරනැන්ට හරිනැත කියන පස්වෙනිවාදයට ප්‍රත්‍යුත්තරනම්? තෙලෙස්ධුතාංගයන් අත රෙන් තෙචීවරිකාංගයහැර අනිකුත් ධුතාංගයන් සාමණේරනැන් විසිනුත් ධරන්ටපුළුවන්හැටි පෙන්වාතිබෙන කාරණයනිසාද මතකචීවරභාජනයෙහිදී සාමණේරනැන්ට සහළුසිවුරක් නැතිබව හැඟෙනනිසාදැයි යනාදිකාරණයන් හෙතුකොටගෙණ සාමණේර නැන්ට ගැටවටුකිරීම හරිනැතකියා සමහර ස්ථවිරයන්වහන්සේ ලා කියන්නාහුය. එසේවී නුමුත් ඊටවෙනස්ව කාරණයන් පෙන්වා දෙන්ට තිබෙනවාය. කෙසේද? පබ්බජ්ජාහි සරණාගමනෙනෙව සිඩා සිකඛාපදානි පන කෙවලං සිකඛාපරිපූරණත්ථං ජානිතබ්බානි තස්මා පාලියා ආගතනයෙන උග්ගහෙතුං අසක්කොන්තස්ස ගාය

කායචි භාසාය අඩ්ඪවසෙනාපි අවික්ඛිතුංවට්ටති යාවපන අනන්තා සික්ඛිතබ්බසික්ඛාපදනි නජානාති සංඝාටිපත්තචීවර ධාරණාදීනි සජ්ජාදිසු පානභොජනවිධිම්හිච න කුසලො හොති තාව භොජන සාලංවා සලාකභාජනඨානංවා අඤ්ඤංවා තථාරූපඨානං න පෙසෙ තබ්බොසතාහිකා චවරොපයෙව කාතබ්බා බාලදරකොවිය පටිජග්ගි තබ්බො සබ්බමස්සකප්පියාකප්පියං ආචික්ඛිතබ්බං නිවාසනපාරු පනාදි ආභිසමාචාරිකෙසු විනෙතබ්බොති,, යනු සමන්තපාසාදිකා අටුවායි "ආභිසමාචාරිකෙසු විනෙතබ්බොති ඉමිනා සෙඛියා උප ජ්ඣායවත්තාදි ආභිසමාචාරිකසීලමෙනත පූරෙතබ්බං, තත්ථ අක තතබ්බස්සච කරණෙ කත්තබ්බස්සච අකරණෙ දණ්ඩකම්මාරහොති දීපෙති,, යනු සාරත්ථදීපනීටීකායි. ආභිසමාචාරිකෙසු විනෙතබ්බො ති ඉමිනා සෙඛියා වත්තක්ඛන්ධකවත්තෙසු අඤ්ඤසු ච සුක්කවි සඝිකාදිලොකවජ්ජෙසු සික්ඛාපදෙසු සාමණෙරෙහි වත්තිතබ්බං තත්ථ අවත්තමානො අලජ්ජි දණ්ඩකම්මාරහො හොතීති දසෙසති,, යනු විමතිවිනොදනීටීකායි, ආභිසමාචාරිකෙසු විනෙතබ්බොති, එවනෙතා සෙඛියා උපජ්ඣායවත්තාදි ආභිසමාචාරිකසීලම්පෙනත පූරෙතබ්බං තත්ථ වාරිත්තස්ස ච අකරණෙ අචාරිත්තස්ස ච කරණෙ දණ්ඩකම්මාරහොති දීපෙතීති, යනු වජිරබුද්ධිටීකායි මෙසේ විනා යාත්තගීත අටුවාටීකාදි පොත්වල ප්‍රකාශවනහැටියට සාමණෙර තැන්ටත් ගැටවටුකිරීම යොග්‍යබව හැඟෙනවාය එසේවිනමුත් විනයධරයන් වහන්සේලා හා සමග ශාකච්ඡාකොට සුදුසු විදි යක් ගතයුතුවත්ඇර සාමණෙරතැන්ට ගැටවටුකිරීම යොග්‍ය වේවා නොවේවා සෙඛියා වතෙහි දැක්වූ පරිමණ්ඩල නිවාසන පාරුපනාදි අනිකුත් ආභිසමාචාරිකසියලුම ශික්ෂාවල්හි සහ කාද්‍ර වත්හිද ගුරුවරයන්විසින් සාමණෙරතැන් මනාකොට හික්මවීම පිණිස උත්සාහකළයුත්තේය. තැවතද,

"විනයං පඨමා ගරුකෙ ඨාතබ්බං" යනුද ආචිණ්ණකප්පො බො ආවුසො එකච්චො කප්පති එකච්චො න කප්පති,, යනුද පරීක්ෂා කටයුතුවත්තේයි. තවද, විනයෙ සුප්පටිපන්නො භික්ඛු සීලසම්පදං නිස්සාය තිස්සො විජ්ජා පාපුණාති, යනුවෙන් විනයනොවරදවා පිළිපැද්දහු එමකුශලබලයෙන් සියලු සසරදුක්නසා ත්‍රිවිද්‍යාප්‍රා ප්තව අමෘතමහානිර්වාණ පුරප්‍රවිෂ්ටවීමට හෙතුවන්නේයයි දැක්වූ හෙයින්ද ධර්මවිනයදෙක්හි ප්‍රකාශවූ පරිද්දෙන් නිවාසන පාරු පනවිධිය නොවරදවා මනාකොට පවත්වන්නාහුවිනම් මෙලොව චිවත්ජනයන්ගේ චිත්තප්‍රීතිය වර්ධනයවනහෙයින්ද ධර්මවිනයො ද්ග්‍රහණය කැමති ආයති ශාසන පාලකසුපෙසලශික්ෂාකාමී භික්ෂු

සාමණේර ශිෂ්‍යසමූහයාට සුනිවත්ථසුපාරුතත්වය කරගැණීමට පහසුලැබෙනහෙයින්ද පරිමණ්ඩලනිවාසන පාරුපනාදි සේඛියා පූරණය ඇතිකල්හි ප්‍රාතිමෝක්‍ෂසංවරශීලය සම්පූර්ණවනහෙයින් දැයි යනාදිනොයෙක් ආනිසංසයන් සලකාගෙණ මෙහිප්‍රථම දක්වනලද පරිමණ්ඩල ශික්‍ෂාපදය සහ සුපටිච්ඡන්නශික්‍ෂාපදය ගැණද ප්‍රකාශවූ පරිද්දෙන් සොන්තොළුවාවට සමකර මණ්ඩලාකාරයෙන්ම අඳනය ඇඳීමද එසේම කොන්තොළුවා නානාප්‍රකාරවිකාරදක්වා නොපෙරවා දෙකොණසමකර මණ්ඩලාකාරයෙන්ම උත්තරාසංගය පෙරවීමද නැවත අඩනමාගීය චෛත්‍යස්ථානය යනාදිස්ථානයන්හැර යම්කිසිකරුණක් සඳහා ඇතුළුගමටයනකල්හිද ඇතුළුගම නිෂද්‍යකරණකල්හිද උත්තරාසංගය සහ සංඝාටිකයද එකටඅල්වා සගුණකාර දෙවුරවසාපෙරවා ගැටවටුකරගෙණ ගමන නිසීදනදෙකකිරීමදැයි යනාදිචාරිත්‍ර ධර්මයන් සැම්දෙනාවහන්සේලාවිසින්ම නොසාඩව මනාකොට පිළිපදිමින් ආත්මාර්ථපරාර්ථසිද්ධි සම්පාදනය සඳහා උත්සාහකළමැනවි.

මෙසේ මේපොතලියා ප්‍රසිද්ධකළේ ශ්‍රී බුද්ධවර්ෂයෙන් දෙදාස්තුන් සියඅට අනූවර්ෂයට පැමිණි මෙම වර්ෂයෙහි අතුරලියෙ කීර්ති ශ්‍රී සුමංගලාභිධාන හම්බන්තර මාතරදිසාවේ නායක උන්වහන්සේ විසිනි.

## සිද්ධිරස්තු.

# අතිපුරාණ පාරුපනවත.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

(මෙය පිටපත් කරගත් පැරණි පුස්කොළ පොතේ මුල පත් ඉරුව සොයාගන්නට නොහැකිවූයෙන් දෙවෙනි පත්ඉරුවේ පටන් මෙහි ලියනු ලැබේ)

---

පාරුතං එකසාටකපාරුතං සුරාසොණ්ඩපාරුතං අන්තෙපුරිකපාරුතං මහාජෙට්ඨකපාරුතං කුටිපවෙසකපාරුතං බ්‍රාහ්මණපාරුතං පාලිකාරකපාරුතන්ති එවමාදි පරිමණ්ඩලලක්ඛණතො අඤ්ඤථා පාරුපනං සබ්බමෙතං ගිහිපාරුතං නාම, යථා සෙතපටා අඩ්ඪපාලකනිගණ්ඨා පාරුපන්ති යථා ච එකච්චෙ පරිබ්බාජකා උරං විවරිත්වා ද්වීසු අංසකූටෙසු පාරුපනං ඨපෙන්ති, යථා ච එකසාටකා මනුස්සා නිවත්ථසාටකස්ස එකෙන අන්තෙන පිට්ඨිං පාරුපිත්වා උභො කණ්ණෙ උභොසු අංසකූටෙසු ඨපෙන්ති, යථා ච සුරාසොණ්ඩාදයො සාටකෙන ගීවං පරික්ඛිපිත්වා උභො අන්තෙ උරෙ වා ඔලම්බෙන්ති පිට්ඨියං වා ඛිපන්ති, යථා ච අන්තෙපුරිකායො අක්ඛිතාරකමත්තං දස්සෙත්වා ඔගුණ්ඨිකං පාරුපන්ති, යථා ච මහාජෙට්ඨකා දීඝසාටකං නිවාසෙත්වා තස්සෙව එකෙන අන්තෙන සකලසරීරං පාරුපන්ති, යථා ච කස්සකා ඛෙත්තකුටිං පවිසන්තා සාටකං පලිවෙඨෙත්වා උපකච්ඡකෙ පක්ඛිපිත්වා තස්සෙව එකෙන අන්තෙන සරීරං පාරුපන්ති, යථා ච බ්‍රාහ්මණා උභින්නං උපකච්ඡකානං අන්තරෙන සාටකං පවෙසෙත්වා අංසකූටෙසු පක්ඛිපන්ති, යථා ච පාලිකාරකො භික්ඛු එකංසපාරුපනෙන පාරුතං වාමබාහුං විවරිත්වා චීවරං අංසකූටෙ ආරොපෙති, එවං අපාරුපිත්වා සබ්බ'පි එතෙ අඤ්ඤෙ ච එවරූපෙ පාරුපනදොසෙ වජ්ජෙත්වා නිබ්බිකාරං පරිමණ්ඩලං පාරුපිතබ්බං. තථා අපාරුපිත්වා ආරාමෙ වා අන්තරඝරෙ වා අනාදරෙන යංකිඤ්චි විකාරං කරොන්තස්ස දුක්කටං.

යත මේ විනය අටුවාදෙක්හිම දක්වූ ක්‍රමයයි විනය විනිශ්චයෙහිද:—

"අවිසෙසෙන වුත්තත්තා ඉදං සික්ඛාපදද්වයං
තස්මා ඝරෙ විහාරෙ වා කාතබ්බං පරිමණ්ඩලං"යි

දක්වූහ. සාරත්ථදීපනීයෙහිද "විහාරෙති බුද්ධුපට්ඨානාදි කාලං සන්ධාය වුත්තං"යි දක්වූහ, මෙහි ආදි ශබ්දයෙන් ථෙරදස්සනා දිය දක්වා කීහ, මේ විනයපිටකයෙහි උත්තරාසංගය පොරවන සැටි දක්වූ විධියි.

සූත්‍රපිටකයෙහි බ්‍රහ්මායුසූත්‍රයෙහිද:— "නච තස්ස භොතො ගොතමස්ස කායෙ චීවරං අච්චුක්කට්ඨං හොති නච අච්චොක්කට්ඨං"යි මෙහි සත්‍යයෙහි "නච අච්චුක්කට්ඨං හොති, ඉතා උස් කොට නගා නොපොරවන සේක; නච අච්චොක්කට්ඨං, ඉතා පාතට බහා නොපොරවන සේක; මෙහි උස්කොට පෙරවීමේ හා පාතට බහා පෙරවීමේ ලක්ෂණ නම්:—යම් මහණෙක් සිවුර අනුඇටයෙන් මත්තට නගා පොරවාද ඔහුගේ ඒ පෙරවීම ඉතා උඩට නගා පෙරවීම නම්, යමෙක් ගොප්මස දක්වා බහා පෙරවාද ඔහුගේ ඒ පෙරවීම ඉතා යටට බහා පෙරවීම නම් වෙයි. හෙවත් යමෙක් දෙපාර්ශවයෙන් සිවුර නගා උදරය විවෘත කොට යේද ඔහුගේ ඒ පෙරවීමද ඉතා උඩට නගා පෙරවීම නම් වෙයි. යමෙක් ඒකාංශ කොට තනය විවෘතකොට යේද ඔහුගේ ඒ පෙරවීමද ඉතා පහත් කොට පෙරවීම නම් වෙයි. ශාස්තෘවූ බුදුරජතෙමේ මේ සියල්ලම නොකරණසේක. මෙහි අටුවායෙහිද "අච්චුක්කට්ඨන්ති යො හි යාව හනුකට්ඨිතො උක්ඛිපිත්වා පාරුපති තස්ස අච්චුක්කට්ඨං නාම හොති යො යාව ගොප්ඵකා ඔතාරෙත්වා පාරුපති තස්ස අච්චොක්කට්ඨං හොති යො හි උභතො උක්ඛිපිත්වා උදරං විවරිත්වා යාති තස්ස අච්චුක්කට්ඨං හොති යො එකංසං කත්වා ථනං විවරිත්වා යාති තස්සපි

අච්චොක්කට්ඨං. සත්ථා තං සබ්බං න කරොති."

ගැටවටු ගන්වන විධි වදාළ සැටි මහවගෙහි:—

"සචෙ උපජ්ඣායො ගාමං පවිසිතුකාමො හොති නිවාසනං දාතබ්බං පටිනිවාසනං පටිග්ගහෙතබ්බං, කායබන්ධනං දාතබ්බං, සගුණං කත්වා සංඝාටියො දාතබ්බා, සචෙ උපජ්ඣායො පච්ඡා සමණං ආකඞ්ඛති තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සංඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා පත්තං ගහෙත්වා උපජ්ඣායස්ස පච්ඡාසමණෙන හොතබ්බං"

සුළුවග්ගෙහිද:—දායකයන් විසින් කල්දූන්වූ කල්හි දන් වැළඳීමට යන්නට සඟළ සිවුර හා උත්තරාසංගය එක්කොට අල්වා පොරවන පරිදි "සචෙ ආරාමෙ කාලො ආරොචිතො හොති තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සංඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුංචිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා සාධුකං අතරමානෙන ගාමො පවිසිතබ්බො"ති.

පිණ්ඩපාතයේ යන කල්හිද සඟළ උත්තරාසංගය එක්කොට පොරවන්නට වදාළ සැටි එම සුළුවග්ගෙහි "පිණ්ඩචාරිකෙන භික්ඛවෙ භික්ඛුනා ඉදානි ගාමං පවිසිස්සාමීති තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සංඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා සාධුකං අතරමානෙන ගාමො පවිසිතබ්බො"යි මෙසේ මහවග සුළුවග දෙක්හි වත්තක්ඛන්ධකවල හැටියට සඟළ සිවුරත් උත්තරාසංග සිවුරත් එකතුකර පොරවා යන කල්හි සිවුර සුලඟේ යන බැවින් ගණ්ඨිකපාස අනුදැන වදාළ පරිදි "තෙන ඛො පන සමයෙන ආයස්මා ආනන්දො ලහුකාය සංඝාටියා පාරුපිත්වා ගාමං පිණ්ඩාය පාවිසි වාතමණ්ඩලිකාය සංඝාටියො උක්ඛිපි(සි)ංසු අථ ඛො ආයස්මා ආනන්දො ආරාමං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි **'අනුජානාමි භික්ඛවෙ ගණ්ඨිකං පාසකන්ති"**යි මෙසේ......................ගණ්ඨිපාසා අනුදැන වදාළ වගයි.

තවද ඡබ්බග්ගික භික්ෂූන් උදෙසාම "තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡන්ති =:පෙ:= **සුප්පටිච්ඡන්නො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා, සුප්පටිච්ඡන්නෙන අන්තරඝරෙ ගන්තබ්බං යො අනාදරියං පටිච්ච කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡති ආපත්ති දුක්කටස්ස"** (යි වදාළ සේක) **"සුප්පටිච්ඡන්නො අන්තරඝරෙ නිසීදිස්සාමි"** යන සතරවෙනි (ශික්ෂා) පදයත් එසේමය. මෙහි අටුවාවෙහිද **"සුප්පටිච්ඡන්නොති** සුට්ඨු පටිච්ඡන්නො ගණ්ඨිකං පටිමුඤ්චිත්වා අනුවාතන්තෙන ගීවං පටිච්ඡාදෙත්වා උභොකණ්ණෙ සමං කත්වා පටිසංහරිත්වා යාවමණිබන්ධං පටිච්ඡාදෙත්වා අන්තරඝරෙ ගමිස්සාමීති අත්ථො, තථා අකත්වා ජත්තුං වා උරං වා විවරිත්වා ගච්ඡන්තස්ස ආපත්තියෙව, **ගණ්ඨිකං පටිමුඤ්චිත්වාති** ගණ්ඨිකං පාසකෙ පවෙසෙත්වා" යනු විනයාලඞ්කාරටීකායි. ඡබ්බග වහන්දැම උදෙසා **"න උක්ඛිත්තකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කර**

ණීයා, න උක්ඛිත්තකාය අන්තරඝරෙ ගන්තබ්බං යො අනාදරියං පටිච්ච ඒකතො වා උභතො වා උක්ඛිපිත්වා අන්තරඝරෙ ගච්ඡති ආපත්ති දුක්කටස්ස, අන්තො ඉන්දඛීලතො පට්ඨාය න එවං ගන්තබ්බං" (යි) නිසිදනයෙහිත් මෙමනයයි.

දසමෙ:- නිසින්නකාලෙ ධම්මකරකං නීහරන්තෙනාපි චීවරං අනුක්ඛිපිත්වා නීහරිතබ්බො වාසූපගතස්ස අනාපත්ති" යනු අටුවායි. මාතෘකා අටුවා පිටපොතෙහිද "ඉන්දඛීලතො පට්ඨාය, පරික්ඛිත්ත ආරාමයාගේ ඇතුළු එළිපත සිට(ද) අපරික්ඛිත්ත (ආරාමයාගේ) පරික්ෂෙපාර්හ ස්ථානයෙහි (පටන්) දෙලෙඩ්ඩුපාතයෙහි සිට මෙසේ නොයායුතුයයි දක්වූහ. පරිවාරපාඨයෙහිද "යං තෙන භගවතා අරහතා ජානතා පස්සතා සම්මා සම්බුද්ධෙන අනාදරියං පටිච්ච පුරතො වා පච්ඡතො වා ඔලම්බෙන්තො නිවාසෙන්තස්ස දුක්කටං,,යි (යනුද)

පුරතො වා පච්ඡතො වා ඔලම්බෙන්තෙන පාරුපන්තස්ස දුක්කටං, අනාදරියං පටිච්ච කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡන්තස්ස දුක්කටං, (යනුද) අනාදරියං පටිච්ච කායං විවරිත්වා අන්තරඝරෙ නිසීදන්තස්ස දුක්කටං, (යනුද) අනාදරියං පටිච්ච උක්ඛිත්තකාය අන්තරඝරෙ ගච්ඡන්තස්ස=පෙ=නිසීදන්තස්ස දුක්කටං, කත්ථ පඤ්ඤත්තන්ති? සාවත්ථියං පඤ්ඤත්තං; කං ආරබ්භාති? ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ; යනාදියද පරිවාරපාළියි.

මෙසේ බුදුන් විසින් වර්ජිතකොට හරවා වදාරණලද දුර්නිවසන දුෂ්පාරුත ලක්ෂණයෙන් දුරුව අනුදැන වදාරණලද සුනිවස්ත්‍ර සුපාරුතව ප්‍රථම ආර්‍යවංශයෙහි පිහිටා උපසම්පන්න භික්ෂූන් විසින් යම්සේ අඳනා පොරෝනා සගලි සිවුරු දැරියයුතුද එසේම සාමණේරතැන් විසිනුත් සගළ පාසිවුරු දැරිය යුතුය, ඒ බව පාලි මුත්තකවිනයෙහි හා සමන්තපාසාදිකාවෙහි:—

"පබ්බජ්ජාහි සරණාගමනෙනෙව සබ්බසික්ඛාපදානි පන කෙවලං සික්ඛාපරිපූරණත්ථං ජානිතබ්බානි, තස්මා පාළියා ආගතනයෙන උග්ගහෙතුං අසක්කොන්තස්ස යාය කායචි භාසාය අත්ථවසෙන'පි ආචික්ඛිතුං වට්ටති, යාව පන අනෙන සික්ඛිතබ්බසික්ඛාපදානි න ජානාති සංඝාටිපත්තචීවරධාරණට්ඨානනිසජ්ජාදිසු පාන භොජනාදිවිධිම්හි ච න කුසලො හොති තාව භොජනසාලං වා සලාකභාජනට්ඨානං වා අඤ්ඤං වා තථාරූපට්ඨානං න පෙසෙතබ්බො, සන්තිකාවචරොයෙව කාතබ්බො, බාලදාරකො විය පටිජග්ගිතබ්බො, සබ්බමස්ස කප්පියාකප්පියං ආචික්ඛිතබ්බං, නිවාසනපාරුපනාදි ආභිසමාචාරිකෙසු විනෙතබ්බො"යි මෙසේ දැක්වූ අටුවාපාඨයෙහි සංඝාටිපත්තචීවරධාරණ යන පදවලින් සඟළ සිවුර පාත්‍රය (හා) සෙසු සිවුරුද සාමණේරතැන් විසින් ධරණ බව පෙන්වූහ. 'ආභිසමාචාරිකෙසු විනෙතබ්බො' යන්නෙන් සේඛියාවෙහි හා ඛන්ධ වත්වල සාමණේර තැන් හික්මවාලිය යුතු බව දැක්වූහ. මෙහි යම් කෙනෙකුන්ට සැක උපදීනම් හේ දුරුවන පිණිස "ආභිසමාචාරිකෙසු විනෙතබ්බොති ඉමිනා සෙඛියං උපජ්ඣායවත්තාදි ආභිසමාචාරිකං සකල මනෙන පූරෙතබ්බං, තත්ථ කාතබ්බස්ස අකරණෙ අකත්තබ්බස්ස ච කරණෙ දණ්ඩකම්මා'රහොති දීපෙති" යනු සාරාර්ථදීපනී විනයටීකායි.

ආභිසමාචාරිකෙසු විනෙතබ්බොති ඉමිනා සෙඛියා වත්තක්ඛ
න්ධකවත්තෙසු අඤ්ඤෙසු ච සුක්කවිස්සට්ඨිආදිලොක වජ්ජසික්ඛාපදෙ
සු සාමණෙරෙහි වත්තිතබ්බං, තත්‍ථ අවත්තමානො අලජ්ජී දණ්ඩක
ම්මාරහො හොතීති දස්සෙති'' යනු විමතිවිනොදනීටීකායි.

ආභිසමාචාරිකෙසු විනෙතබ්බොති වචනතො සෙඛියපණ්ණා
යවත්තාදි ආභිසමාචාරිකසීලමෙත්ත පූරෙතබ්බං, තත්‍ථ චාරිත්ත
ස්ස ච අකරණෙ වාරිත්තස්ස ච කරණෙ දණ්ඩකම්මාර හොති දීපෙ
ති'' යනුවජිරබුද්ධිටීකායි.

මෙසේ අනෙකප්‍රකාරයෙන් දක්වාවදාරාතිබෙන සිවුරුඅඳින
පොරවන විධි නොවරදවා උගතයුතුබව දක්වා වදාරණ අභිකථි
චාරීන් විසින් "නිවාසනපාරුපනං සාධුකං උග්ගණ්හිතබ්බමෙව සංවිච්ච
අනුග්ගණ්හන්තස්ස හි අනාදරියං සියා එවං නිවාසෙස්සාමීති ආරා
මෙ'පි අන්තරඝරෙ'පි සබ්බත්‍ථ සික්ඛාකාතබ්බා, අනාදරියං පටිච්ච
දුක්කටං තත් නිවාසනපාරුපනං අජානන්තස්ස මොක්ඛො නත්‍ථි''යි අටුවා
යෙහි කියනලදී. මෙහි ටීකායෙහි ද "උස්සන්නතීවජ්ජනාති ඵුස්සන්ද
වණ්ණරො උපනිස්සයෙරො පන අනාදරියවසෙනෙව ආපජ්ජිත
බ්බත්තා කෙවලං අකුසලමෙව පකතිසාවජ්ජං සංවිච්ච වීතික්කම
නං ච දොමනස්සිතස්සෙව හොති, තස්මා ලොකවජ්ජං අකුසලචි
ත්තං දුක්ඛවෙදනන්ති ආහ, අනාදරියං අනාපත්තිකාරණා'භාවෙ
අපරිමණ්ඩලතාති ඉමානෙත්‍ථීති අඞ්ගානි'' යනු සාරත්‍ථදීපනී ටී
කායි.

මෙසේ සුප්‍රමාණව එකපටින් කරණලද අඳනය දණමඩලින් පා
ත අටඟුලක් බහා මණ්ඩලා'කාරව අඳින විධි හා පිණ්ඩපාතාදිය
ගැණ ග්‍රාමප්‍රවිෂ්ට වන කල්හි නොවරදවාම අඳනය පිට පටියබඳින
විධි හා පුෂ්ප සුගන්ධ පූජාදියට සුගතබොධි චෛත්‍යාංගන
වනකල්හි දෙකොණ සමව තොත්ගල් නොඑල්වා මණ්ඩලා'කාරය
නොවරදවා එකාංශකොට උත්තරාසංගය පොරවන විධි හා ගම
මැදින් යැමට තිසි කාරුණක් ඇතිකල්හි සගලඋත්තරාසංග දෙක
එකට අල්වා මණ්ඩලාකාරව ගැටවටු ගන්වන විධිද මෙහි දෙශනා
අටුවා ටීකාදියෙහිවූ පරිද්දෙන් මෙසේ සංග්‍රහ කොට දක්වනලදී.
මෙසේ දෙසනාකරණලද විනයප්‍රඥප්තියෙහි "අනුජානාමි භික්ඛවෙ
තිගුණංසංඝාටිං''යි දෙපටින් කරන්ඩ අනුදැනවදාළ සගලසිවුර ඒ
හැටි නොකොට අනුප්‍රඥප්තියකුත් නැතිබැවින් දැනට සමහර කෙ
නෙක් එකපටින් කරගැණීම විනයට විරුඬබව මහවග්ගපාළියෙන්

හා අටුවාවෙන් පෙණෙන්නේය. එපමණක් නොව උපසම්පදාමාලකයෙහිදීද ආචාරීන්වහන්සේලා විසින් "සුණසි නාගඅයං තෙ සච්චකාලො භූතකාලො" යනාදිය කියා ඉක්බිති 'අයං තෙ පත්තො අයං සංඝාටි'යි විචාරීමද 'පරිපුණ්ණං තෙ පත්තචීවරං'යි විචාරීමද 'ආමභන්තෙ'යි කියා ඊට ප්‍රතිවචනදීමද අභූතයක් සම්ප්‍රලාපයක්බවද; සහළ සිවුර දෙපටින් නැති බැවින් පෙණීය හැකිවාන් සඟ සිවුරුඅධිෂ්ඨානයෙහිද එකපටින්, සාරණලද උත්තරාසංගයක් ඇරගෙණ "ඉමං සංඝාටිං අධිඨාමි"යි කියා ඉටීමද "ඉමාය සංඝාටියා කඨිනං අත්ථරාමි"යි කෙළින් ඇතිරීමද බුද්ධදෙශනාවේ හැටියට දෙපටින් නොකෙරෙණ බැවින් විනයට විරුද්ධබව පෙණෙනවාය. තවද මීටත් වඩා විරුද්ධයක් පෙණීයනවාය කවරේද? අනුදන්න වදාළ කායබන්ධනය බඳිනපමණක් මිස සිවුරු ඇතුලෙන් හෝ පිටතින් හෝ තනාමත් නෙන් පටන් මදපතුල දක්වාම රෙදිපටියකින් හෝ හුල්වැල් ආදියකින් හෝ කිසිම පටියක් බඳින්ඩ බැරිබව බුදුන්විසින්ම "න භික්ඛවෙ කටිසුත්තං ධාරෙතබ්බං"යි ආඥකරවදාරා තිබෙන්නාය. ඒවම අටුවාචාරීන් විසින්ද "කටිසුත්තකන්ති සංකිපිත්වාපිලන්ධනං අනාමසො සුත්තකතන්තුමත්තමෙපිති"යි දක්වූබැවින්ද උදරෙහි පටිබඳිනා තැන කටිපරියාපන්නබව අටුවාචාරීන් විසින්ම "පිට්ඨිවෙමජ්ඣාවාටතො පන හදයා'වාටතො ච පට්ඨාය යාව පාදනාඩසිඛා අයං කටිපරිච්ඡෙදො"යි වදාළබැවින්ද අමුතුවෙන්පටියක් බඳින්ඩම බැරිහැටි පෙණනවා සහ බොහෝ ධම්විනයධරවරුන් එලෙසම කියනවාය. තවද අමුතුපටිය නිසා පචිතිපොතෙහි හා සුළුවග මහවග දෙක්හිත් වදාළ බොහෝ ශික්ෂාපද රාශියක් රක්ෂා නොවී ඇරියන්නාය. ඒ කවරේද? ද්‍රවිඩසිංහලාදි බොහෝ ස්ත්‍රීපුරුෂාදි කොනෙක් උත්තරසාටකාදියක් පොරවාගෙන පටියක් බැඳගන්න යන ගෘහස්ථනිවාසන පාරුපන වගේකුත් ලොව තිබෙන බැවින් බුදුන් විසින් "න භික්ඛවෙගිහිනිවාසනං නිවාසෙතබ්බං, න භික්ඛවෙ ගිහිපාරුපනං පාරුපිතබ්බං"යි වදාරා ආඥ කරනිබෙනාබැවින් ධම්විනයෙහි නැතිබුදුන් රහතුන් විසින් නොකී නොකල අමුතුපටියක් බැඳීම වදාරා තිබෙන ඒ ප්‍රඥප්තියට විරුද්ධබව පෙණෙන්නාය.

තවද උත්තරසංගය දෙකොණ සමව මණ්ඩලාකාරයට නොපොරවා දෙකොණ ලුහුඬු කොට හැදගෙණ පටිය බඳිනබැවින් "පරිමණ්ඩලං පාරුපිස්සාමි" යන ශික්ෂාපදය හා "පරිමණ්ඩලන්ති සමන්තතො මණ්ඩලං" යන අටුවා වචනද රක්ෂා නොවනබව පෙණෙන්නාය.

එසේම දැනට උත්තරාසංගය නතිකොට ඇඳර්ට උඩින් සිවුරක් හැටවවුගන්වා යම්කිසිකරුණක් ගැණගමට වැදූනකල්හි සැරයටි වටාපත් ආදිය ගන්නා පිණිස දකුණුඅත එලියට ගත්තාම ඒ පැත්තෙන් සිවුර උස්වදුවූ අයටත් අවලක්ෂණව මණ්ඩලාකාරයත් වැරදී වැලමිට බහුශිර්ෂය දක්වාම අප්‍රතිච්ඡන්නව පෙණීයනබැවින් "පරිමණ්ඩලං පාරුපිස්සාමි" යන ශික්ෂාපදයද "සුප්පටිච්ඡන්නො" යන ශික්ෂාපදදෙකද "න උක්ඛිත්තකාය අන්තරඝරෙ" යන ශික්ෂාපද දෙකද යන මේ ශික්ෂාපද පසක්ම නොරැකී බිඳී යනබව පෙණෙන්නාය.

තවද උත්තරාසංගයත් සඟළසිවුරත් එකටඅල්වාපොරවා ගැට වටු නොගන්වා නනීකර වෙත්වෙත්ව පොරවනබැවින් "සගුණං කත්වා සංඝාටියො පාරුපිතබ්බා"යි වදාළ බුද්ධවචන සිද්ධ නොවන බව සහ අටුවා රාශියක් නෙකෙරී ඇරීයනබවත් පෙණේන්නාය

මේ බුදුන් විසින් නොපනවා වදාළ පටිය බැඳීම ගැණ වදාළ ශික්ෂාපදරාසියක් නොරැකී යන බව මෙසේ විමසා බැලියයුතු තවද සූත්‍රපිටකයෙහි;


තිචීවරං ච පත්තො ච වාසි සූචිං ච බන්ධනං,
පරිස්සාවනෙන අට්ඨෙතෙ යුත්තයොගස්ස භික්ඛුනො;යි.

දක්වූ අටපිරිකරෙහිද පටිදෙකක් නැත, එකම කායබන්ධනය පමණය "නවපරික්ඛාරිකස්ස පන සෙය්‍යං පවිසන්තස්ස තත්‍රට්ඨකප ච්චත්ථරණං වා කුංචිකා වා වට්ටති, දසපරික්ඛාරිකස්ස නිසීදනං වා චම්මඛණ්ඩං වා වට්ටති එකාදසපරික්ඛාරිකස්ස කත්තරයට්ඨිවා තෙල නාලිකං වා වට්ටති, ද්වාදසපරික්ඛාරිකස්ස ඡත්තං වා උපාහනං වා වට්ටතීති, යනු දෙලොස් පිරිකරයි, මෙසේ දක්වූ අටපිරිකරට නව පටියක් ගත්තාම නවපිරිකරවෙනවාය, දෙලොස්පිරිකරට ගත් තාම තෙලෙස්පිරිකරක් වෙනවාය එසේ පරිෂ්කාරසංඛ්‍යා පරිච්ඡේද පරිහීනතාව පමණකුත් නොව අල්පපරිෂ්කාරකාමිවූ අල්පේච්ඡස න්තුෂ්ට ප්‍රව්‍රජිතයන් වහන්සේලාට හා ඇතැම් ධර්මවිනයධරයන්ටද අල්පලෝක වද්‍යභීරු ප්‍රව්‍රජිතයන් වහන්සේලාටද ධර්මවිනයානුකූල ව නිවාසනපාරුපන කරගැණීමට බලමදිබැවින් නිත්‍යවිනාසනන පාදියවීමද තමතමන් වහන්සේලාගේ ශිෂ්‍යබාලශ්‍රද්ධාප්‍රව්‍රජිත ශික්ෂා කාමීවූ ආයතිසාසනපාලකවූ සුගතෞරසයන්ගේ නිවාසනපාරුප නාදිය දුරින්දුරුව බාලජනනන්දිත ධීරජනනින්දිත ලීලාවිභූෂා විල ම්බනාඩම්බරාදියෙන් යුක්තව නිවාසනපාරුපනාදිය පැවැත්වීමට අවකාස ලැබීමද ධර්මවිනයෙහි වූලෙස නිවාසන පාරුපනවිධිය

නොපවත්නේමක්නිසාදැයි යන ඒ ඒ නිකායවාසීන්ගේ වාදමර්දනය කිරීමට අසමර්ථබවද යනාදි අනේකාකාර ආදීනව ඇතිවනබැවින් හා විනයෙහි දුෂ්ප්‍රතිපන්නවූවාහු නිරවද්‍යදෙය සෙයින් සාවද්‍යවූ නිවාසනපාරුපනාදිය කොට දුස්සීලව දුර්ගති ප්‍රාප්තවීමද "විනයෙ සුප්පටිපන්නො භික්ඛු සීලසම්පදං නිස්සාය තිස්සො විජ්ජා පාපුනාති"යි යනුවෙන් විනය නොවරදවා පිළිපැද්දහු ඒකුශලබලයෙන් සකලසංසාරදුක් නසා ත්‍රිවිද්‍යා ප්‍රාප්තව අමෘතමහානිර්වාණ ප්‍රාප්තවනබැවින්ද, තවද බුදුන් වදාළලෙස නිවාසනපාරුපන විධි කෙරේ නම් මෙලොව ඒවත්ජනාභිප්‍රසාදනාදිය සහ ධර්මවිනයොද්ග්‍රහණකාමිවූ අයනිශාසනපාලක භික්ෂුශ්‍රාමණෙරාදි ශිෂ්‍යසමූහයන්ට සුනිවසත සුපාරුතාවය කරගැණීමට ඵාසුපිණිස හා නිවාසනාදියෙහි පරිමණ්ඩල ත්‍රිමණ්ඩලලක්ෂණාදි සෙඛියාපූරණය යහපත්ව ඇතිකල්හි ප්‍රාතිමොක්ෂශීලයද සම්පූර්ණ වනබැවින් අන් කිසිමදෙයක් නොසිතා මතුලබන ස්වර්ගමොක්ෂ සම්පත්තිප්‍රතිලාභය සලකා යථොක්ත නිවාසනපාරුපනවත පිරීමට උත්සාහකළමැනවි.

සිද්ධිරස්තු.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු